සටහන

2025 ඔක්තෝබර්-දෙසැම්බර්
44 වෙළුම 10 - 12 කලාපය

2 රුපියල් 2000 සමරු නෝට්ටුව

3 බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් (Authorized Money Changers) පිළිබඳ හැඳින්වීමක්

9 මහ බැංකුවේ ස්වාධීනත්වය නීතිමය ඇසින්...

17 ඩිජිටල් ගනුදෙනු සරලයි, ක්ෂණිකයි, සුරක්ෂිතයි

රු. 150/-

9 781373 261038
ISSN 1391-3697

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව



රුපියල් දෙදාහ
සමරු මුදල් නෝට්ටුව

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නෝට්ටුවේ ඉදිරිපස

නෝට්ටුවේ පිටුපස

රුපියල් 2000 සමරු මුදල් නෝට්ටුව

රුපියල් 2000 වටිනාකමකින් යුත් මෙම සමරු මුදල් නෝට්ටුව 2025 අගෝස්තු 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය සනිටුහන් කිරීම සඳහා නිකුත් කරන ලදී. මෙම සංවත්සරයේ තේමාව වන "සමෘද්ධිය උදෙසා ස්ථාවරත්වය" යන්නෙන් ජාතික ප්‍රගතිය සඳහා පදනම වන ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා වන මහ බැංකුවේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරයි. මෙම අනන්‍ය මුදල් නෝට්ටුව, ජාතියට අවුරුදු 75ක අඛණ්ඩ සේවය සමරමින්, ආර්ථිකයෙහි ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසර ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් මහ බැංකුවේ භූමිකාව ඉස්මතු කරයි. එමෙන්ම, මහ බැංකුවේ දැක්ම හා මෙහෙවර තුළ ප්‍රකාශ වන අභිප්‍රායන් සහ ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය සඳහා මහ බැංකුව විසින් කරනු ලබන අඛණ්ඩ කැපවීම ද මෙම මුදල් නෝට්ටුවෙන් නිරූපණය කරනු ලබයි.

75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025

1


2

සැලකිල්ලෙන් බලන්න 1 2

මුදල් නෝට්ටුව හරහා ආලෝකය ගමන් කරන ලෙස අල්ලාගෙන කඩුව රැගත් සිංහයා සහිත දිය සලකුණ සැලකිල්ලෙන් බලන්න.

මුදල් නෝට්ටුව හරහා ආලෝකය ගමන් කරන ලෙස අල්ලාගෙන කඩුව රැගත් සිංහයාගේ රුව සහිත විනිවිද පෙනෙන ආරක්ෂණ සලකුණ සැලකිල්ලෙන් බලන්න.

මුදල් නෝට්ටු නිර්මාණයෙහි ඇතුළත් ඉතා කුඩා අක්ෂර සැලකිල්ලෙන් බලන්න.


3

ඇල කර බලන්න 3

මුදල් නෝට්ටුව තිරස් අතට ඇල කර බැලීමේ දී ආරක්ෂණ නූලේ ඇතුළත් කර ඇති කොළඹ ප්‍රදීපාගාර ඔරලෝසු කණුව සහ 2000 ඉලක්කම් නිල් වර්ණයේ සිට කොළ වර්ණය දක්වා වෙනස් වීම නිරීක්ෂණය කරන්න.

4


5

ස්පර්ශයෙන් හඳුනා ගන්න 4 5

උස්ව මුද්‍රණය කර ඇති නෝට්ටුවේ 2000 වටිනාකම සහ ශ්‍රී ලංකා මහ බැංකුව නමැති පාඨය ස්පර්ශයෙන් හඳුනා ගන්න.

එමෙන්ම එක් එක් තීරුව අවසානයේ දියමන්තියක හැඩයක් සමග උස්ව මුද්‍රිත තීරු හය ස්පර්ශයෙන් හඳුනා ගන්න. මෙම සලකුණ දෘශ්‍යාබාධිත පුද්ගලයින්ට නෝට්ටුවේ වටිනාකම හඳුනා ගැනීමට උපකාර වේ.

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් (Authorized Money Changers) පිළිබඳ හැඳින්වීමක්

පී. ජී. එන්. කේ. පරණගම
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
විදේශ විනිමය දෙපාර්තමේන්තුව

01. හැඳින්වීම

බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් යනු මහජනතාව වෙත ඇති විදේශ මුදල් මිලදී ගැනීමට, විදේශ මුදල් හුවමාරු කිරීමට සහ මහජනතාවට විදේශ මුදල් විකිණීමට ශ්‍රී ලංකා මහ බැංකුව අවසර දී ඇති බලයලත් ආයතන වෙයි. 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි ඇති ප්‍රතිපාදනයන්ට අනුකූල ව විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා නීත්‍යානුකූල අවසරපතක් ලබාගැනීම අනිවාර්ය වන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව මගින් නිශ්චිත කාලසීමාවක් සඳහා පමණක් වලංගු වන සහ විදේශ මුදල් හුවමාරුකරන්නන්ගේ කාර්යසාධනය මත පදනම් ව නැවත යාවත්කාලීන කරනු ලබන මෙම අවසරපත්‍රය නිකුත් කරනු ලැබේ.

ඒ අනුව බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ලෙස පහත කාණ්ඩ යටතේ අවසරපත් ලබාදීමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කෙරේ.

(i) A කාණ්ඩය: බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ලෙස එම ව්‍යාපාරයෙහි පමණක් ම නියැලෙන සමාගම්

(ii) B කාණ්ඩය: බලයලත් වෙළෙඳුන් ලෙස පත්කර ඇති බැංකු හැර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන (උදා: ලියාපදිංචි විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්)

(iii) C කාණ්ඩය: සංචාරක හෝටල් (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත තරු හතර හෝ ඊට ඉහළ වර්ගීකරණයක් සහිත හෝටල්)

(iv) D කාණ්ඩය: අනෙකුත් ආයතන (උදාහරණයක් ලෙස සිල්ලර වෙළෙඳාමෙහි යෙදෙන ව්‍යාපාර ජාල)

ඉහත කාණ්ඩ හතර අතුරින් බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ලෙස එම ව්‍යාපාරයෙහි පමණක් ම නියැලෙන සමාගම් එනම් A කාණ්ඩයේ බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ගැන පමණක් මෙම ලිපිය මගින් සාකච්ඡා කෙරෙයි.

බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් රටෙහි මූල්‍ය අතරමැදිකරණයේ නිරත වන පාර්ශ්ව අතරින් එක් පාර්ශ්වයක් වන අතර ඔවුන්ගෙන් මූල්‍ය පද්ධතියේ වර්ධනයට සහ ස්ථායිතාවට සැලකිය යුතු සේවාවක් ඉටුවෙයි. මන්ද යත්, විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය හරහා මහජනතාවගෙන් මිල දී ගන්නා ලද විදේශ මුදල් නිශ්චිත කාලයක් තුළ දී බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් විසින් වාණිජ බැංකුවක තැන්පත් කිරීමේ අවශ්‍යතාව ඇති අතර එය මහජනතාව වෙත ඇති විදේශ මුදල් රටෙහි විධිමත් මූල්‍ය පද්ධතිය තුළට ඉක්මනින් එකතු වීමකට හේතුවන බැවිනි. එය රටෙහි බැංකු පද්ධතියේ විදේශ මුදල් නෝට්ටුවල සුලභතාව කෙරෙහි ද බලපාන අතර බැංකු හරහා සිදුකරන අනෙකුත් විදේශ විනිමය ගනුදෙනු සඳහා මෙම විදේශ මුදල් යොදා ගැනීමට හැකි වෙයි.

මෙලෙස රටෙහි බැංකු පද්ධතියට එක් නොකර මහ ජනතාව වෙත රඳවාගෙන සිටින විදේශ මුදල් (උදාහරණයක් ලෙස මෙම විදේශ මුදල් විදේශ සංචාරයක් කිරීමෙන් පසු ඉතිරි කරගෙන ආ විදේශ මුදල්, විදේශ රටක රැකියාවක් කරන නිවාඩුවක් ගත කිරීමට මෙරටට පැමිණි පුද්ගලයන් රැගෙන එන විදේශ මුදල්, එලෙස විදේශ රටක සේවය කරන පුද්ගලයන්ගේ ඥාතීන් රැගෙන එන විදේශ මුදල්, සෘජු ව ම හෝ සංචාරක මගපෙන්වන්නෙකු හරහා විදේශීය සංචාරක ව්‍යාපාරය මගින් ලැබෙන විදේශ මුදල්) බොහෝ විට විදේශ මුදල් හුවමාරුකරන්නන් මගින් රුපියල්වලට මාරු කිරීමට මහජනතාව කටයුතු කරන අතර එම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසරලත් විදේශීය මුදල් හුවමාරු කරන ආයතනවල ප්‍රදර්ශනය කිරීමට නියම කර ඇති, අවසරලත් විදේශීය මුදල් හුවමාරු කරන්නෙකු බව මහජනතාවට දැනුම් දෙන ලාංඡනය

ක්‍රියාවලිය සුළු ප්‍රමාණ වශයෙන් මහජනතාව වෙත රඳවාගෙන සිටින විදේශ මුදල් අවසාන වශයෙන් බැංකු පද්ධතියට එකතු වීමකට ඉඩකඩ සලසයි.

ඒ අනුව රටෙහි විදේශ විනිමය වෙළෙඳපොළ මනා ක්‍රියාකාරිත්වය කෙරෙහි බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන්ගේ කාර්යභාරයෙහි වැදගත්කම පෙන්වා දිය හැකි ය.

02. විදේශ මුදල් හුවමාරු වෙළෙඳාමෙහි නිරත වීම සඳහා විදේශ මුදල් හුවමාරුකරන්නන් වෙත නෛතික ප්‍රතිපාදන සැලසෙන අයුරු

විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය සමඟ කියවිය යුතු 4(2) (https://dfe.lk/web/images/downloads/acts/fca_e.pdf#page=3) සහ 6 වන වගන්තිය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, විදේශ විනිමය සම්බන්ධ බලයලත් වෙළෙන්දෙකු (වාණිජ බැංකු සහ විශේෂිත බැංකු) නොවන්නාවූ යම් තැනැත්තකුට, තැනැත්තන් කාණ්ඩයකට හෝ කාණ්ඩවලට[1] තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පමුණුවනු ලැබිය හැකි නියමවලට සහ කොන්දේසිවලට යටත්ව අවසර පත්‍රයේ නිශ්චිත ව සඳහන් කරන ලද කාර්යය සඳහා ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය වෙළෙඳාම් කිරීම පිණිස අවසර දෙනු ලැබිය හැකි ය.

03. බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නෙකුට අවසර හිමිවන කාර්යයන්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්ට පහත සඳහන් කාර්යයන් කිරීම සඳහා අවසර ලබාදිය හැකි ය.

i. ශ්‍රී ලංකා රුපියල් ලබාදී විදේශ මුදල් මිල දී ගැනීමට

ii. එක් විදේශ මුදල් වර්ගයක් තවත් විදේශ මුදල් වර්ගයක් සමග හුවමාරු කිරීමට

iii. ශ්‍රී ලංකා රුපියල් ලබාගෙන විදේශ මුදල් විකිණීමට

සෑම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නෙකුට ම විදේශ මුදල් මිලදී ගැනීමට සහ හුවමාරු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසර ලබා දී ඇත. මීට අමතර ව විදේශ මුදල් විකිණීම සඳහා මෙම බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන්ගෙන් කිහිප දෙනෙකුට පමණක් අවසර ලබා දී ඇත.

04. විදේශ මුදල් හුවමාරු කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම

රජයේ නියෝජිතයා වශයෙන් විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යයක් ලෙස, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමිත සමාගම්වලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් ව ශ්‍රී ලංකාව තුළ බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන්

---

1. විදේශ විනිමය පනතට අනුව මෙම පිරිස පරිසීමිත වෙළෙන්දන් (Restricted Dealers) වශයෙන් හඳුන්වන අතර බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් අයත් වනුයේ ද මෙම කාණ්ඩයටයි.

   ඒ අනුව විදේශ විනිමය පනතේ 4 (3) ප්‍රතිපාදන ප්‍රකාරව විදේශ විනිමය පනතින් අන්‍යාකාර ලෙසින් විධිවිධාන සලසා ඇති පරිදි හැරෙන්නට, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් බලයලත් වෙළෙන්දකුගේ මාර්ගයෙන් හෝ අවසර පත්‍රයේ නිශ්චිත ව සඳහන් ප්‍රමාණය තෙක් පරිසීමිත වෙළෙන්දකුගේ මාර්ගයෙන් හෝ හැර, ශ්‍රී ලංකා රුපියල් හෝ ශ්‍රී ලංකාව තුළ වත්කම් විදේශ විනිමයට පරිවර්තනය කිරීමට සම්බන්ධිත යම් ක්‍රියාවක් මගින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව විදේශ විනිමය වෙළෙඳාම නොකළ යුතු ය.

ලෙස කටයුතු කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලබයි. ඒ සඳහා සුදුසුකම් සහිත සමාගම්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.

මෙම අයදුම්පත සහ බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නෙකු ලෙස පත්වීම සඳහා අයදුම්කාර සමාගමක් විසින් ඒ සඳහා සුදුසුකම් ලැබීමට සම්පූර්ණ කළ යුතු නිර්ණායක සහ අදාළ නියම හා කොන්දේසි පිළිබඳ මාර්ගෝපදේශ (Guidelines) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන http://www.dfe.lk මගින් බාගත කරගත හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද සමාගම්වලට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වීම සඳහා නිශ්චිත කාලසීමාවක් සඳහා පමණක් වලංගු අවසර පත්‍රයක් ලබාදෙන අතර ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති නිර්ණායක සහ නියම හා කොන්දේසි සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය සලකා බලා ඉදිරි කාල පරිච්ඡේදයක් සඳහා නව අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

05. බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් වෙත නිකුත් කොට ඇති විධාන

විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය සමග කියවිය යුතු 4 (2) සහ 6 වන වගන්තිය ප්‍රකාර ව බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් විසින් විදේශ මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීම සහ විකිණීම විදේශ විනිමය පනත යටතේ 2025 මාර්තු මස 10 වන දින නිකුත් කරන ලද, 2025 අංක 01 දරන විධානයන්ට යටත් ව සහ විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි ඇති නියම සහ කොන්දේසිවලට අනුකූල ව සිදු කළ යුතු ය.

එවැනි නියම කර ඇති ප්‍රධාන විධාන/කොන්දේසි කිහිපයක් පහත පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.

i. විදේශ විනිමය දෙපාර්තමේන්තුව නිකුත් කරන අවසර පත්‍රය, අවසර පත්‍ර අංකය සහිත සමාගමේ නාම පුවරුව සහ නියම කර ඇති කොන්දේසිවලට අනුකූල ව සකසන ලද බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නෙකු බව හඟවන ලාංඡනය, බලයලත් ව්‍යාපාරික ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය.

ii. විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත ව සිටින ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය, සහ ප්‍රධාන කළමනාකරණ ම (බලයලත් මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි සමස්ත මෙහෙයුම් සම්බන්ධ ව වගකීම දරන පුද්ගලයන්) ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති නිර්ණායක ප්‍රකාර ව යථා යෝග්‍ය (සුදුසු හා ඡරදවැර) පුද්ගලයන් විය යුතු ය.

iii. බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් ගනුදෙනු කරන වාණිජ බැංකුව/ බැංකු සමග ඇතිකර ගත් පූර්ව ගිවිසුම/ ගිවිසුම් මත ඔවුන් වෙත විකිණිය හැකි විදේශ මුදල් පමණක් මුදල් හුවමාරුකරන්නාගේ බලයලත් ව්‍යාපාරික ස්ථානවල දී භාරගත යුතු ය.

iv. විදේශ මුදල් මිලදී ගනු ලබන හා විකුණන දෛනික විනිමය අනුපාතික බලයලත් ව්‍යාපාරික ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ය. විදේශ මුදල් හුවමාරුකරන්නන් විසින් ඉහත ගිණුම/ගිණුම් පවත්වාගෙන යනු ලබන වාණිජ බැංකුව/ බැංකු විසින් ඔවුන් වෙත ප්‍රදානය කරන ලද විනිමය අනුපාත කාණ්ඩ නොඉක්මවමින් ශ්‍රී ලංකා රුපියල් ලබා දීමට හෝ ඕනෑම විදේශ මුදල් වර්ගයක් සඳහා හුවමාරු කිරීමට මහජනතාව වෙත ඇති විදේශ මුදල් නෝට්ටු භාරගත යුතු ය.

v. මිලදී ගන්නා ලද, හුවමාරු කරන ලද හෝ විදේශ මුදල් විකිණීමෙන් පසු ශේෂය ලෙස පවතින විදේශ මුදල් එම මිලදී ගැනීමේ හෝ හුවමාරු කිරීමේ දින සිට ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති නිශ්චිත දින ගණනක් ඇතුළත වාණිජ බැංකුවක/බැංකු සමඟ එම කාර්යය සඳහා ම විවෘත කර පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා රුපියල් ගිණුමක/ගිණුම්වල තැන්පත් කළ යුතු ය.

vi. විදේශ මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් විසින්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට විදේශයන්හි සංචාරය කිරීමේ අරමුණ සඳහා පමණක් ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති උපරිම සීමාවකට යටත් ව විදේශ මුදල් විකිණීම සිදුකළ යුතු ය.

vii. විදේශ විනිමය දෙපාර්තමේන්තුව නියම කර ඇති පරිදි විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ වාර්තා පවත්වා ගැනීමත්, තොරතුරු වාර්තා කිරීමත් මුදල් හුවමාරුකරන්නන් විසින් සිදුකළ යුතු ය.

06. විදේශ මුදල් හුවමාරු කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු

ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනය සහ විවිධත්වය සමග නීත්‍යානුකූල නොවන ආකාරයට විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වන පුද්ගලයන්ගේ සහ ආයතන පිළිබඳ මහජන පැමිණිලිවල වර්ධනයක් දැකගත හැකි ය. මොවුන් බලයලත් වෙළෙඳුන් හෝ බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ප්‍රදානය කරනු ලබන විනිමය අනුපාතිකවලට වෙනස් විනිමය අනුපාතික තම ගනුදෙනුකරුවන් වෙත ප්‍රදානය කරමින් අවිධිමත් අයුරින් තම ව්‍යාපාරය කරගෙන යයි. ගනුදෙනුකරුවන් සමග තමා ගනුදෙනුව සිදු කළ බවට කිසිදු සහතිකවීමක් හෝ වගකීමක් භාර නොගනිමින් කිසිදු විනිවිදභාවයකින් හෝ සද්භාවයකින් තොර ව මෙම පුද්ගලයන් සහ ආයතන නීත්‍යානුකූල නොවන ආකාරයට විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වෙයි. මෙසේ නීත්‍යානුකූල නොවන විදේශ මුදල් හුවමාරු කරන්නෙකු සමග විදේශ මුදල් ගනුදෙනු කිරීම ඉතා අවදානම් සහගත වන අතර, පාරිභෝගිකයකුට එමගින් සිය මුදල් අහිමි වීමට ද ඉඩකඩ විවර වෙයි. මන්ද, ඕනෑ ම මූල්‍ය ගනුදෙනුවක් සිදු කරන විට ගනුදෙනුකරුවා සහ මූල්‍ය ආයතනය අතර අදාළ ගනුදෙනුව සම්බන්ධයෙන් විනිවිදභාවයකින් මෙන් ම අදාළ ගනුදෙනුව දෙපාර්ශ්වය අතර සිදු කළ බව ලදුපතක් හරහා සහතික කර දීමක් සිදු කළ යුතු වුවත්, මෙවැනි නීත්‍යානුකූල නොවන ආකාරයට විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වන පුද්ගලයන් සහ ආයතන එවැනි වගකීමක් භාර නොගන්නා බැවිනි. එබැවින් තමන්ට විදේශ මුදල් ලැබුනේ කෙසේද යන්න නීත්‍යානුකූල ව ඔප්පුකර පෙන්වීමට ඔවුන් සමග ගනුදෙනු කළ මහජනතාවට නොහැකි වන අතර මේ නිසා මූල්‍ය වංචාවන්ට හසුවීමට ද මහජනතාව මෙවැනි අනවසර පාර්ශ්ව සමග ගනුදෙනු කිරීමෙන් ඉඩකඩ විවර කර ගනී. තව ද, මෙසේ නීත්‍යානුකූල නොවන ආකාරයට විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරවල නිරතවන පුද්ගලයන්/ආයතන තමා ගනුදෙනු කළ විදේශ මුදල් රටේ සමස්ත මූල්‍ය/බැංකු පද්ධතියට එකතු කිරීමක් සිදු නොකරන අතර නීත්‍යානුකූල නොවන ගනුදෙනු වෙනුවෙන් (උදා- ත්‍රස්තවාදී කටයුතු/මත්ද්‍රව්‍ය ප්‍රවාහනය) මෙම විදේශ මුදල් යෙදවීමේ හැකියාව පවතී. මෙය ආර්ථික හා සාමාජීය වශයෙන් රටට ඉතාමත් හානිකර තත්ත්වයකි.

මෙසේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසරයක් ලබා නොගෙන විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වන අනවසර හෙවත් නීත්‍යානුකූල නොවන විදේශ මුදල් හුවමාරුකරන්නන්ට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් සහිත ව වුවත් අවසර පත්‍රය මගින් ලබා දී ඇති අවසරය ඉක්මවා කටයුතු කරන (උදාහරණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ මුදල් මිළදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා පමණක් අවසර ලබා දී ඇති මුත් විදේශ මුදල් විකිණීමෙහි ද නිරත වීම) සහ තමාගේ ගිණුම/ගිණුම් පවත්වා ගෙන යන වාණිජ බැංකුව/බැංකු විසින් තමන්ට ප්‍රදානය කරනු ලබන විනිමය අනුපාතිකවලට වඩා ඉහළ විදේශ විනිමය අගයකට විදේශ මුදල් මිල දී ගනු ලබන ඇතැම් බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් පිළිබඳ කලින් කලට වාර්තා වෙයි. මෙසේ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද අවසර පත්‍රයට මුවාවෙන් නියම කර ඇති නිර්ණායක, නියම සහ කොන්දේසි කඩ කරමින් නීත්‍යානුකූල නොවන ආකාරයට විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවන ආයතන සමග ගනුදෙනු කිරීම ද පෙර සඳහන් කළ අනවසර විදේශ මුදල් හුවමාරු කරන්නන් සමග විදේශ විනිමය ගනුදෙනු කරනවා සේම අවදානම් සහගත වන අතර එය රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කරයි. එබැවින් බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නෙකු වෙතින් ඔවුන්ට පැවරී ඇති බලයලත් කාර්ය සලකා බලා විදේශ මුදල් හුවමාරු කිරීම සැමගේ ම යුතුකමක් මෙන්ම වගකීමක් ද වන අතර එමගින් සිදු කළ ගනුදෙනුව සම්බන්ධ නෛතික ආරක්ෂණයක් ද සැලසෙයි.

ඒ අනුව විදේශ මුදල් හුවමාරු කරන්නන් සමග ගනුදෙනු කරන මහජනතාවට ද තමන් කළ ගනුදෙනු ව නීත්‍යානුකූල ආකාරයෙන් සිදුවනවා ද යන්න සලකා බැලීම වගකීමක් වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර පත්‍රයක් නිකුත් කර ඇති විදේශ මුදල් හුවමාරු කිරීමේ ආයතන වෙතින් පමණක් ගනුදෙනු ව සිදුකර ගැනීමත් එහි දී තමා සිදු කළ ගනුදෙනුව නිසි ආකාරයට සහ නෛතික සිදුවූවා ද යන්න විමසා බැලීමක් ද සිදුකළ යුතු ය.

මෙහි දී මහජනතාව විදේශ මුදල් හුවමාරු කරන්නෙකු සමග විදේශ මුදල් ගනුදෙනුව සිදු කිරීමේ දී මූලික වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණු පහත පරිදි ගොනු කළ හැකි ය.

i. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් හුවමාරු කරන්නන් වෙත ප්‍රදර්ශනය කිරීමට නියම කර ඇති මුදල් හුවමාරු කිරීමේ ලාංඡනය (රූපය 1) ප්‍රදර්ශනය කර තිබේ ද යන්න

ii. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නිශ්චිත කාල සීමාව සටහන් ව ඇති අවසර පත්‍රයක් තිබේ ද යන්න

iii. අවසර පත්‍රයේ සඳහන් කර ඇති පරිදි එම විදේශ මුදල් හුවමාරුකරන්නාට කළ හැකි අවසරලත් කාර්ය මොනවාද යන්න පිළිබඳ ව සහ තම ගනුදෙනුව ඊට අනුකූල ද යන්න

iv. විදේශ මුදල් නෝට්ටු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන දෛනික විනිමය අනුපාතිකය ප්‍රදර්ශනය කර තිබේද යන්න සහ ගනුදෙනුව සිදුවනුයේ එම අනුපාතිකවලට අනුකූලව ද යන්න

v. තමා කළ ගනුදෙනුවට අදාළ ව, විදේශ මුදල් හුවමාරු කරන ආයතනය විසින් තමන් හට ලදුපතක් නිකුත් කරනවාද යන්න. එසේ නොමැතිනම් ලදුපතක් ඉල්ලා සිටීම.

vi. ලබාදුන් ලදුපතෙහි බලයලත් ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය, දුරකථන අංකය, මහ බැංකුව නිකුත්කර ඇති අවසර පත්‍රයේ අංකය, දිනය, ගනුදෙනුකරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකය, තමන් ගනුදෙනු කළ විදේශ ව්‍යවහාර මුදල් වර්ගය, ලබාදුන්/විකුණූ විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය, ප්‍රදානය කරන ලද විනිමය අනුපාතිකය, ඔවුන් නිකුත් කරන ලද රුපියල් හෝ විදේශ මුදල් ප්‍රමාණය අවම වශයෙන් ඇතුළත් ව ඇත් ද යන්න

එසේම ඉහත සඳහන් කළ පරිදි නීත්‍යානුකූල නොවන ආකාරයෙන් විදේශ මුදල් වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවන පුද්ගලයන් පිළිබඳ ව නිශ්චිත තොරතුරු විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම ද මහජනතාවගේ වගකීමක් වන අතර එමගින් මහජනතාව ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන්ට එරෙහි ව සුදුසු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට එම දෙපාර්තමේන්තුවට හැකිවනු ඇත.

07. විදේශ විනිමය පනත යටතේ නිකුත් කළ නියෝග, නියම, විධානවලට අනුකූල ව ක්‍රියාකිරීමට අසමත් වීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් බලයලත් විදේශ මුදල් හුවමාරුකරුවන් අඛණ්ඩ ව අධීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව යම් බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නෙකු විදේශ විනිමය පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ නිකුත් කරන ලද නියෝගයකට, නියමයකට, විධානයකට, මාර්ගෝපදේශයකට අනුකූල ව ක්‍රියාකිරීමට අසමත් වුවහොත් විදේශ විනිමය පනතේ ප්‍රතිපාදනය ප්‍රකාර ව එම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නාට එරෙහි ව ක්‍රියාකිරීමට විදේශ විනිමය පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට බලය පැවරී ඇත.

බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නෙකු අවසරපත්‍රයේ ඇති නියම හෝ කොන්දේසිවලට පටහැනි ව විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වීමට එරෙහි ව ශ්‍රී ලංකා මහ බැංකුවට ගතහැකි ක්‍රියාමාර්ග විදේශ විනිමය පනතේ 11 වන ප්‍රතිපාදනය (https://dfe.lk/web/images/downloads/acts/fca_e.pdf#page=13) මගින් දක්වා ඇති අතර ඒ පිළිබඳ මෙම ලිපිය මගින් දීර්ඝ වශයෙන් පැහැදිළි කිරීමක් සිදුනොකරයි.

08. විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය රටේ සංවර්ධනය සඳහා තවදුරටත් මෙහෙයවීමට ගතහැකි ක්‍රියාමාර්ග

බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් හරහා විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය තවදුරටත් රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක කර ගැනීමට නියාමකයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවටත්, එම නියාමනයන්ට යටත් ව වෙළෙඳාමෙහි නිරත බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්ටත් එසේ ම මහජනතාවටත් වගකීමක් ඇත. ඒ අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් බලයලත් විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය වඩා විධිමත් ව පවත්වා ගැනීමට මෙන් ම එහි නියාමන කටයුතු වඩා පුළුල් ව ක්‍රියාත්මක කිරීමෙහි ලා නව විචක්ෂණශීලි ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කොට ඇති අතර ඒවායින් කිහිපයක් පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකි ය.

i. බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් වෙත නිකුත් කර තිබූ සියලු නියම, නිර්ණායක සහ කොන්දේසි නැවත විශ්ලේෂණය කරමින් සියලු විදේශ මුදල් හුවමාරුකරන්නන් කොටස් හතරක් යටතේ නව වර්ගීකරණයකට ලක්

කරමින් යාවත්කාලීන කරන ලද නව නියමයක් 2025 මාර්තු මස 10 වන දින නිකුත් කිරීම (2025 අංක 01 දරන නියමය). මෙම නියමය මගින් වෙන් වෙන් වශයෙන් එක් එක් කාණ්ඩයට අදාළ වන නියම පැහැදිලි ව සඳහන් කර තිබීම මුදල් හුවමාරුකරන්නන්ට ඔවුන්ගේ ව්‍යාපාරය අදාළ නියමයන්ට අනුගත ව කිරීමට පැහැදිලි මාර්ගෙ ්පදේශයක් සලසනවා සේ ම අනෙක් අතට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට ද විවිධ කාණ්ඩ යටතේ සිදු කරන අඛණ්ඩ අධීක්ෂණ කටයුතුවලට ද පහසුවක් සලසනු ඇත.

ii. විදේශ මුදල් හුවමාරු කිරීමේ ආයතනවල සිටින අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයේ යෝග්‍යතාව සලකා බලන නිර්ණායක (Fit and Proper Criteria) සෑම පැතිකඩක් ම ආවරණය වන ලෙස වඩා පුළුල් දෘෂ්ටියකින් යුතු ව සංශෝධනය කිරීම.

iii. විදේශ මුදල් හුවමාරුකරන්නන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන ක්‍රියාවලියට යටත් කර ගැනීම වඩා ශක්තිමත් කරගැනීම සඳහා සියලු අනුකූලතා සහ නියාමන කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු අනුකූලතා නිලධාරියෙකු (Compliance Officer) ඔවුන් විසින් පත් කිරීම අනිවාර්ය කිරීම. මෙම අනුකූලතා නිළධාරියා විසින් මුදල් හුවමාරු කිරීමේ අවසරපත නැවත අලුත් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවට අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔහුගේ අත්සනින් යුතු පසුගිය වසරට අදාළ නියාමන වාර්තාවක් ලබා දීම ඒ අනුව සිදු කළ යුතු ය.

iv. මුදල් හුවමාරු කරන්නන් විසින් මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් සැපයීම මැඩ පැවැත්වීමට අදාළ නීති සහ අවශ්‍යතාවන්ට සෑම විටම අනුකූල ව කටයුතු කළයුතු බව විශේෂයෙන් නියෝග කිරීම සහ විදේශ විනිමය දෙපාර්තමේන්තුව මෙහෙයවනු ලබන අඛණ්ඩ එතැන් පරීක්ෂණවල දී (Onsite Inspections) මේ පිළිබඳ ව විශේෂයෙන් සලකා බැලීම.

v. විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය නිසි පරිදි ක්‍රියාත්මක කරන ආකාරය හා ඒ හා සම්බන්ධ කාලීන තොරතුරු පිළිබඳ ව විදේශ මුදල් හුවමාරු කරන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් කිරීම.

vi. නීත්‍යානුකූල විදේශ මුදල් හුවමාරු කරන්නෙකු වෙතින් ගනුදෙනු සිදුකර ගැනීමේ වැදගත්කම මෙන් ම අනවසර විදේශ මුදල් හුවමාරු කරන්නන් සමග ගනුදෙනු කිරීමේ අවදානම පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් විවිධ මාධ්‍ය හරහා අවශ්‍ය පරිදි අදාළ රජයේ වෙනත් ආයතනයන් ද සම්බන්ධ කර ගනිමින් සිදු කිරීම.

09. ශ්‍රී ලංකාවේ දැනට සිටින බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් පිළිබඳ විස්තර

යාවත්කාලීන කරන ලද ශ්‍රී ලංකාවේ දැනට අවසරපත් ලබා දී ඇති විදේශ මුදල් හුවමාරු කරන්නන්, ඔවුන්ට ශ්‍රී ලංකා මහ බැංකුව අවසර ලබා දී ඇති කාර්ය, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක සහ ලිපින පිළිබඳ විස්තර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන http://www.dfe.lk මගින් බාගත කර ගත හැකි ය.■

මහ බැංකුවේ ස්වාධීනත්වය නීතිමය ඇසින්...

එම් වරුණී ප්‍රියදර්ශනී
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නීති දෙපාර්තමේන්තුව

වර්තමාන ලෝකය විවිධාකාරයේ හැල හැප්පීම්වලට ලක්වෙමින් විවිධ දිශානතීන්වලට දෝලනය වෙමින් අප කැටුව ම ගමන් කරමින් පවතී. මෙකී ගමන් මග තුළ සාම්ප්‍රදායික මහබැංකුකරණයෙන් ඔබ්බට සිය වපසරිය පුළුල් කරමින් බලවත් රාජ්‍යයන් විසින් පනවනු ලබන නව බදු ප්‍රතිසංස්කරණ, අනපේක්ෂිත භූ දේශපාලනික කැලඹීම්, කාලගුණික විපර්යාසයන්ගෙන් ජනිත වන නව අවදානම්, ජනගහන ව්‍යුහයන්ගේ ඇතිවන වෙනස්කම් වැනි මුදල් ප්‍රතිපත්තියෙන් මුළුමනින්ම පාහේ පරිබාහිර අභියෝගවලට මුහුණ දෙමින් සිය මෙහෙයුම් සිදු කිරීමේ දී සියලු මහ බැංකු සෑමවිට ම සිය මෙහෙයුම් ස්වාධීනත්වය ආරක්ෂා කරගත යුතු බව බොහෝ ආර්ථික, සමාජයීය හා දේශපාලනික විද්වතුන් ගේ මතය වී තිබේ.

ඒ අනුව, මහ බැංකුවක ස්වාධීනත්වය යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? එහි ඇති සාධනීය වැදගත්කම, ඒ සඳහා ඇති නිර්ණායක කවරේ ද? එකී ස්වාධීනත්වය සමඟ අත්වැල් බැඳගන්නා ආනුෂංගික කාරණා කවරේ ද? නව ශ්‍රී ලංකා මහ බැංකු පනත තුළ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හිමිවන්නේ කෙබඳු ආකාරයක ස්වාධීනත්වයක් ද? යන කාරණා ලඝුකොට දැක්වීම මෙම ලිපියේ අරමුණ වේ.

මහ බැංකුවක ස්වාධීනත්වය යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

මහ බැංකු ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය ගෝලීය වශයෙන් පසුගිය දශක තුනක පමණ කාලයක් තිස්සේ විවිධ නිර්ණායකවලට අනුව තක්සේරු වෙමින් මහ පොළොව මත යථාර්ථවත් වන්නේ රටක මහ බැංකුව සතු කාර්ය භාරය එරට ජනතාවගේ යහපැවැත්ම සඳහා අතිශයින් ම වැදගත් වන බැවිනි. විශේෂයෙන් ම රටේ මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමේ දී, සිය මුදල් ප්‍රතිපත්ති උපකරණ උද්ධමනය පාලනය සඳහා යොදා ගැනීමේ දී, සිය රටේ උද්ධමන අගය කුමන මට්ටමක පවත්වාගෙන යා යුතු ද යන්න තීරණය කිරීමේ දී, ගෝලීය වශයෙන් මහ බැංකු සැලකිය යුතු මට්ටමේ ස්වාධීනත්වයක් අත්පත් කරගත් බව විද්වත් මතය වේ.

කීර්තිමත් අර්ථ ශාස්ත්‍රඥයෙකු වූ Friedman ට අනුව ස්වාධීන මහ බැංකුවක් යනු රටක මුදල් ප්‍රතිපත්තිය පවත්වාගෙන යෑම පිළිබඳ වගකීම් සහගත වගකීම් සහගත පාලනයක් සිදු කිරීම අරමුණු කොට ගත් ආයතනයක් වන අතර එය එරට ආණ්ඩුව විසින් කරනු ලැබිය හැකි කිසිවකින් බලපෑමට ලක් නොවන්නකි[1]. වෙනත් වචනවලින් කිවහොත් ස්වාධීන මහ බැංකුවක් යනු ව්‍යවස්ථාදායකයේ හෝ විධායකයේ ඍජු පාලනයට හෝ බලපෑමට ලක් නොවන ස්වයංවර්ගික ආයතනයක් වේ.

මහ බැංකු ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය පළමුකොට ගොඩනැගුනේ රටක මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමේ ලා මහ බැංකුවක් සතු ව පවතින අනන්‍ය භූමිකාව හේතුකොට ගෙන වුව ද පශ්චාත් ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පරාවර්තිත ඇතැම් මතවාද වූයේ මහ බැංකු ස්වාධීනත්වය යන සංකල්පය මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමෙන් ඔබ්බට ගොස් මූල්‍ය පද්ධති ස්ථායීතාව හා අවසන් ණය දෙන්නා ලෙස මහ බැංකුව වෙත

1. https://www.cato.org/cato-journal/winter-2020/fresh-look-central-bank-independence accessed on 13.08.2024

පවතින ස්වීය භූමිකාවලින් බැහැර ව කතා කළ නොහැකි බවත්, 1930 න් පසුව ලෝකය මුහුණ දුන් දරුණුතම ආර්ථික ව්‍යසනය වන 1998 ගෝලීය මූල්‍ය අර්බුදයට එක් ප්‍රධාන හේතුවක් වූයේ ද ගෝලීය මහබැංකු විසින් එදා මෙදාතුර මෙහෙයවන ලද ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන් වෙත ලබා දුන් පුළුල් අභිමතය බවත් ඔවුනගේ සාමූහික අසමත්වීම නිසා හටගත් අර්බුදය උදෙසා ඔවුන් කිසිදු හාණිපූරණයක් නොකළ බවත් ය[2]. මේ මතවාද මත එල්බෙමින් ඇතැමුන් තර්ක කරනුයේ කිසිවිටෙකත් මහ බැංකු විෂයයෙහි එවන් ස්වාධීනත්වයක් ලබා නොදිය යුතු බව ය. කෙසේ වෙතත්, මෙවන් අසාධු තර්කනයන් හමුවේ වුව ද මහ බැංකු ස්වාධීනත්වය අභාවිතයෙන් අභාවයට ගිය සංකල්පයක් නොවූයේ එකී චෝදිත මහ බැංකු විසින් ම රාජ්‍ය හා වෙනත් අධිකාරීන්ගේ සහාය ද ඇතිව ගෝලීය ආර්ථිකය බිඳ වැටීමේ අනිටු ප්‍රතිවිපාක හැකිතාක් දුරට මැඩපැවැත්වීමට හා නැවත එවන් අර්බුදයක් හට ගැනීමට ඇති ඉඩකඩ ඇහිරීම නිසා විය යුතු ය.

මහ බැංකු ස්වාධීනත්වය පිළිබඳ සංකල්පයෙහි ඇති සාධනීය වැදගත්කම කුමක් ද?

මහ බැංකුවක් රටක ආර්ථික චින්තනයේ නියමුවා ලෙස කටයුතු කරන අතර සිය ස්වාධීනත්වය හරහා එහි වගවීමේ යාන්ත්‍රණය හා ප්‍රතිපත්තිමය විනිවිදභාවය තහවුරු කරමින් සිය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන මහජන විශ්වසනීයත්වය ඉහළ නංවා ගැනීමක් සිදු කරයි. මහ බැංකු ස්වාධීනත්වය වත්මන් සමාජ හා ආර්ථික වටපිටාව අනුව වරනැගෙනුයේ රටක මුදල් ප්‍රතිපත්තිය ඇසුරෙන් වන අතර ඉන් ගම්‍යමාන වන්නේ මහ බැංකුවක් සිදු කරන මුදල් ප්‍රතිපත්තිය විෂයයෙහි සිදුකරන කාර්යභාරය කිසිවෙකුගේ අධීක්ෂණයකට හෝ ප්‍රශ්න කිරීමකට ලක් නොවී අදිසි හස්තයක් ලෙස ක්‍රියා කිරීම හෝ මහ බැංකුවක් කිසියම් රික්තකයක් තුළ කටයුතු කරන බව හෝ නොවේ. එය අත්‍යන්තයෙන් ම රටක ආණ්ඩුව සමඟ මනා සබැඳියාවකින් කටයුතු කළ යුතු වන ආයතනයක් වේ. එමනිසා මහ බැංකු ස්වාධීනත්වය යන සංකල්පයට දිය හැකි නිවැරදිම අර්ථ නිරූපණය වන්නේ රටක ව්‍යවස්ථාදායකය විසින් එරට මුදල් ප්‍රතිපත්තිය හැසිරවීමට මහ බැංකුව වෙත පවරණ ලද ව්‍යවස්ථාපිත බලතල කිසිදු දේශපාලනික බලපෑමකට නතු නොවී, සරල ව කිවහොත් රටේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ බලපෑමට හසුනොවී ස්වාධීන ව මෙහෙයවීමට ඇති නිදහස වේ. එකී ස්වාධීනත්වය මගින් රටක ආර්ථිකයේ මිල මට්ටම් හා මුදල් සැපයුම රටකට දැරිය හැකි පරිදි අවශ්‍ය සාධාරණ ස්ථරවල පවත්වාගෙන යාම සහතික වන බැවින් එමගින් උද්ධමනයේ විෂම බලපෑම්වලින් රටේ සමස්ත ජනතාවගේ මුදල් ආරක්ෂා වීම සිදු වේ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හරහා රටක ආණ්ඩුවකට පාලනය කළ හැකි වන්නේ රටේ බදු මුදල් ඇතුලු රාජ්‍ය මූල්‍ය පමණක් වන අතර ස්වාධීන මහ බැංකුවක් ඉන් බොහෝ දුරට ඔබ්බට ගොස් රටක සමස්ත ජනතාවගේ ම බැංකු තැන්පතු ඇතුලු සියලු මුදල් කිසිදු බාහිර බලපෑමකින් තොර ව සිය මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම හරහා ආරක්ෂා කරදෙයි.

මහ බැංකුවක් රටක ආර්ථික චින්තනයේ නියමුවා ලෙස කටයුතු කරන අතර සිය ස්වාධීනත්වය හරහා එහි වගවීමේ යාන්ත්‍රණය හා ප්‍රතිපත්තිමය විනිවිදභාවය තහවුරු කරමින් සිය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන මහජන විශ්වසනීයත්වය ඉහළ නංවා ගැනීමක් සිදු කරයි.

මෙකී ස්වාධීනත්වයේ අවශ්‍යතාව ලොව කොතෙක් ප්‍රචලිත වී ද යත් වර්තමානයේ මාස්ට්‍රිච් ප්‍රඥප්තියට අනුව යුරෝපීය මුදල් සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කාර රාජ්‍ය පාර්ශ්වය සතු ව ස්වාධීන මහ බැංකුවක් පැවතීම පූර්ව කොන්දේසියක් වී තිබේ. එසේ ම අතීතයේ සමාජවාදී දේශපාලන මතවාද දැරූ බොහෝ ලතින් ඇමෙරිකානු රටවල් සිය රාජ්‍යයන්හි දිගුකාලීන ව පැවත එන ඉහළ උද්ධමනකාරී වාතාවරණයන් අවම කිරීමේ හා වෙළෙඳපොළ ආර්ථිකය නිසි ලෙස මෙහෙයවීමට අවශ්‍ය පොදු ප්‍රවේශයක් ලෙසට මහ බැංකු ස්වාධීනත්වය අත්‍යවශ්‍ය බව හඳුනාගෙන තිබීම ද මෙකී ස්වාධීනත්වය පිළිබඳව වන සමාජීය කතිකාවත මෙතරම් පුළුල් පරාසයක

2. Ibid

පැතිරී යාමට ප්‍රධාන හේතුවක් වී තිබේ.[3] අනෙක් අතට මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අවභාවිතය හේතුවෙන් ගෙවුම් ශේෂ අර්බුදයන්ට ලක් වූ ලංකාව වැනි රටවල් විෂයෙහි අවසන් ණය දෙන්නා ලෙස සිය විස්තීර්ණ ණය පහසුකම් ලබා දීමේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද ස්වාධීන මහ බැංකුවක අවශ්‍යතාව ඒ ණය පහසුකම සඳහා වන පූර්ව කොන්දේසියක් කොට තිබීම හේතුවෙන් ද එවැනි රටවලට මහ බැංකුව සිය ග්‍රහණයෙන් මුදාහැර ස්වාධීන ආයතනයක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමට සිදු වූ බව ද නොකිවමනා ය. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අවශ්‍යතාව හටගන්නේ ද ශ්‍රී ලංකාවේ වත්මන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහන තුළ ය.

මහ බැංකු ස්වාධීනත්වයේ පිරිවිතරයන් කවරේ ද?

මේ සම්බන්ධ කාරණා සියුම්ව සලකා බැලීමේ දී පෙනී යන ප්‍රධාන කාරණයක් වන්නේ දියුණු හා නැගී එන ආර්ථිකයන් පවතින සියලුම ස්වෛරී රාජ්‍යයන්හි ස්වාධීන මහ බැංකු ස්ථාපිත කොට ඇත්තේ ව්‍යවස්ථාදායකය විසින් පනවනු ලබන අණපනත් හරහා බවයි. එකී අණපනත් මගින් ප්‍රධාන පිරිවිතරයන් තුනක් ඔස්සේ මහ බැංකු ස්වාධීනත්වය මනිනු ලබයි.

(1) **මුදල් ප්‍රතිපත්ති ඉලක්ක සම්බන්ධයෙන් වන ස්වාධීනත්වය:** මෙම ස්වාධීනත්වය තුළ මහ බැංකුවක් සිය මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවිය යුතු ඉලක්ක කවරේදැයි ස්වයංව තීරණය කොට ඒ ඉලක්ක සපුරා ගැනීම සඳහා ස්වයං තීරණ ගැනීමට හැකියාව ලබයි. එනම් ආර්ථිකයේ උද්ධමන ඉලක්ක තීරණය කිරීම ඇතුළු ස්ථාවර පොළී සහ විනිමය අනුපාතික තීරණය කිරීම සඳහා අභිමතයක් මහ බැංකුව සතු වේ.

ස්වාධිකාරී ආයතනයක් ලෙස මහ බැංකුවට සිය මෙහෙයුම් ආණ්ඩුවේ හව්හරණයකින් තොර ව සිදුකිරීමට ඇති මූල්‍යමය ස්වාධීනත්වය මින් අදහස් වේ. එනම් සිය සේවකයන් බඳවා ගැනීම, සිය අයවැය සකස් කිරීම, පොදු හා විශේෂ සංචිත ගොඩනැගීම, සිය ප්‍රාග්ධනය ආණ්ඩුවේ මැදිහත්වීමකින් තොර ව ශක්තිමත් කිරීමට හැකියාවක් ලබා ගැනීම මින් අදහස් වේ.

(2) **මුදල් ප්‍රතිපත්ති මෙවලම් භාවිතය සම්බන්ධයෙන් වන ස්වාධීනත්වය:** මෙකී ස්වාධීනත්වය තුළ මහ බැංකුවක් මුදල් ප්‍රතිපත්ති ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය ආර්ථික මෙවලම් භාවිතයේ නිදහස භුක්ති විඳියි. සිය මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා වඩාත් උචිත ප්‍රතිපත්තිමය මෙවලම කිසිවෙකුගේ හෝ බලපෑමකින් තොර ව භාවිතයට ගැනීමට මහ බැංකුවකට හැකියාව ලැබේ.

(3) **මෙහෙයුම් සම්බන්ධයෙන් වන ස්වාධීනත්වය:** ස්වාධිකාරී ආයතනයක් ලෙස මහ බැංකුවට සිය මෙහෙයුම් ආණ්ඩුවේ හව්හරණයකින් තොරව සිදුකිරීමට ඇති මූල්‍යමය ස්වාධීනත්වය මින් අදහස් වේ. එනම් සිය සේවකයන් බඳවා ගැනීම, සිය අයවැය සකස් කිරීම, පොදු හා විශේෂ සංචිත ගොඩනැගීම, සිය ප්‍රාග්ධනය ආණ්ඩුවේ මැදිහත්වීමකින් තොර ව ශක්තිමත් කිරීමට හැකියාවක් ලබා ගැනීම මින් අදහස් වේ.

ඉහත කී තෙවැදෑරුම් ස්වාධීනත්වය භුක්ති විඳින රටවල් කිහිපයක තතු විමසා බැලීම වටී.

යුරෝපීය සංගමය ක්‍රියාත්මක වීමේ ප්‍රඥප්තියට අනුව යුරෝපීය මහ බැංකු පද්ධතිය නිර්මාණය කරනු ලබන අතර එකී මහ බැංකු පද්ධතියේ මූලික අරමුණ සංගමයේ මිල ස්ථායීතාව පවත්වාගෙන යෑම වේ. යුරෝපීය සංගම් ප්‍රඥප්තියට අනුව සිය බලතල, කාර්යය හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී යුරෝපියානු මහ බැංකුව හෝ වෙනත් කිසිදු දේශීය මහ බැංකුවක් හෝ ඔවුන්ගේ පාලක මණ්ඩල කිසිවක් සිය සංගමයේ අනෙකුත් ආයතනයන්ගෙන්, නිලයන්ගෙන්, ඒජන්තවරුන්ගෙන්, කිසිදු රාජ්‍ය පාර්ශ්වයකගේ හෝ වෙනත් කවර හෝ අස්ථිත්වයක උපදෙස් පැතීම හෝ ලබාගැනීම හෝ සිදු නොකළ යුතු වන අතර එකී සෑම පාර්ශ්වයක් විසින් ම එම මූලධර්මයට ගරු කළ යුතු බවත් යුරෝපියානු මහ බැංකුවේ හෝ අනෙකුත් දේශීය මහ බැංකුවල පාලක මණ්ඩලවලට

3. https://www.elibrary.imf.org/display/book/9781557754196/ch010.xml accessed on 12.08.2025 & 18.08.2025

සිය බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේ දී කිසිදු ආකාරයේ බලපෑමක් නොකිරීමට වග බලාගත යුතු බවටත් ප්‍රතිපාදන සලසා තිබේ[4].

ගෝලීය වශයෙන් ස්වාධීන මහ බැංකුවක් උරුම කරගත් පළමු රට ලෙස සැලකෙන ජර්මනියේ බුන්ඩෙස් බැංකුව යුරෝපීය මහ බැංකුව විසින් යුරෝපියානු කලාපයට නියම කරනු ලබන උද්ධමන ඉලක්කය ජර්මනිය තුළ ළඟා කර ගැනීමට කටයුතු කරනු ලබන අතර සිය මූලික අරමුණ වන මිල ස්ථායීතාව ඇතිකිරීමට අගතියක් නොවන තාක් දුරට ජර්මානු රජයේ ආර්ථික ප්‍රතිපත්ති මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය සහාය ලබා දේ. ජර්මානු කැබිනෙට්ටුවේ සාමාජිකයින්ට බුන්ඩෙස් බැංකුවේ කවුන්සිලයේ රැස්වීම්වලට සහභාගී විය හැකි වුවත් ඔවුනට ඡන්ද බලයක් හිමි නොවනවා සේ ම මෝසමක් මගින් බුන්ඩෙස් බැංකුවේ තීරණ කල් දැමිය හැක්කේ ද උපරිම සති දෙකක කාලයක් සඳහා පමණි[5].

මිල ස්ථායීතාවය මූලික අරමුණ කොටගත් නවසීලන්ත සංචිත බැංකුව සිය මිල ප්‍රතිපත්ති ඉලක්ක නවසීලන්ත රජය හා එක්ව සහයෝගයෙන් තීරණය කරනු ලබයි. ඒ අනුව නවසීලන්ත සංචිත බැංකුවට එකී ඉලක්ක නිර්ණය කිරීමේ ස්වාධීනතාවයක් නොමැති වුවත් එම ඉලක්ක අත්පත්කරගැනීමට අවශ්‍ය වන මෙවලම් තීරණය කිරීමේ ස්වාධීනත්වය නවසීලන්ත සංචිත බැංකු පනත මගින් සාක්ෂාත් කොට තිබේ. කෙසේ වෙතත්, නවසීලන්ත සංචිත බැංකුවට සිය මූල්‍ය/මෙහෙයුම් ස්වාධීනත්වය අපේක්ෂිත පරිදි නොපවතින්නේ බැංකුවට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීමේ ගිවිසුම වසර 5කට වරක් එරට මුදල් අමාත්‍යවරයා සහ නවසීලන්ත සංචිත බැංකුවේ අධිපතිවරයා එක්ව ගිවිස ගන්නා බැවිනි[6].

කලාපීය වශයෙන් ගත් කල අසල්වැසි ඉන්දියාවේ 1934 ඉන්දියානු සංචිත බැංකු පනතින් ස්ථාපිත කරන ලද ඉන්දියානු සංචිත බැංකුව ඉන්දියාවේ මුදල් ප්‍රතිපත්ති තීරකයා නොවන අතර එය සිදු කෙරෙන්නේ එරට මුදල් ප්‍රතිපත්ති කමිටුව මගිනි. ඉන්දියානු රජය විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ඇතුලු සය සාමාජික මුදල් ප්‍රතිපත්ති කමිටුවට මේ හේතුවෙන් රජයේ ආර්ථික ප්‍රතිපත්තිමය අවශ්‍යතා අවධාරණය වීම නවතාලිය නොහේ. එය ඇතැම් අවස්ථාවල දී ඉන්දියානු සංචිත බැංකුවේ භූමිකාව දැඩි ලෙස බලපෑමට ලක්කොට ඇති බව ද ඒ නිසාම ඇතැම් අධිපතිවරුන් පෞද්ගලික කාරණා මත යැයි පවසමින් සිය ධූරවලින් නික්ම ගොස් ඇති බව ද නොරහසකි. එසේ ම 1934 ඉන්දියානු සංචිත බැංකු පනතට අනුව ඉන්දීය රජයට සංචිත බැංකුවට විධාන නිකුත් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපාදන සළසා තිබේ. එසේම, "මහජන යහපත" උදෙසා අවශ්‍යයැයි සිතන අවස්ථාවක දී ඉන්දියානු රජයට සංචිත බැංකු අධිපතිවරයා හා එහි නියෝජ්‍ය අධිපතිවරුන් පත්කළ හැකි වේ[7].

ශ්‍රී ලංකා මහ බැංකුව සතු වන්නේ කවරාකාරයේ ස්වාධීනත්වයක් ද?

ශ්‍රී ලංකා මහ බැංකුව මෙරට ස්ථාපිත වන්නේ 1949 අංක 58 දරන මුදල් නීති පනත මගිනි. පනතේ 2 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව නෛතික පුද්ගලභාවයක් නොමැති හුදු අස්ථිත්වයක් පමණක් විය[8]. මුදල් නීති පනත එය පැනවූ යුගයේ ආර්ථික ප්‍රතිපත්ති මත පිහිටා මනා දැක්මකින් හා මනා කළමනාකරණයකින් යුතු ව කෙටුම්පත් කරන ලද ව්‍යවස්ථාවක් වුව ද මෙරට දශක ගණනාවක් තිස්සේ සිදු වූ විවිධ දේශපාලනික හා ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් හේතුවෙන් එකී පනතේ ප්‍රතිපාදන හරහා ම ශ්‍රී ලංකා මහ බැංකුව සතු ව පැවතිය යුතු ස්වාධීනත්වය යටපත් වූ බව කීම වරදක් නොවේ. විශේෂයෙන් ම මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා මුදල් මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයෙකු වීම, සංවරණ හා තුලන ක්‍රමයකින් තොර ව මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් මහ බැංකු අධිපතිවරයා සහ මුදල් මණ්ඩල සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ඔවුන් එම ධූර දැරීම සඳහා සුදුසු ද නැද්ද යන්න සලකා බැලීමට අවශ්‍ය ශක්තිමත් ක්‍රමවේදයක් නොපැවතීම, රාජ්‍ය මූල්‍යනය සඳහා මහ බැංකුව විසින් ම ප්‍රාථමික

4. යුරෝපියානු පද්ධතියේ මහ බැංකු සහ යුරෝපියානු මහ බැංකුව පිළිබඳව වන ප්‍රඥප්තියේ 04 වන ප්‍රොටොකෝලයේ 7 වන වගන්තිය-**accessed via** https://eur-lex.europa.eu EUR-Lex - 12016M/PRO/04 - EN - EUR-Lex **on 20.08.2025**
5. https://www.elibrary.imf.org/display/book/9781557754981/ch037.xml accessed on 14.08.2025
6. https://www.elibrary.imf.org/display/book/9781557751850/ch010.xml accessed on 14.08.2025
7. "Autonomy of the central bank - changing contours in India" – written by Y Y Reddy
8. මුදල් නීති පනතේ 8 වන වගන්තියට අනුව ඒකී නෛතික පුද්ගලභාවය හිමිවූයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඒවකට පැවති මුදල් මණ්ඩලය වෙත ය.

වෙළෙඳපොළට නිකුත් කරනු ලබන රාජ්‍ය සුරැකුම්පත් අතරින් මිලට නොගෙන ශේෂ වූ භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමට හැකියාව ලබා දී තිබීම, හා රුපියලේ ජාත්‍යන්තර ස්ථායීතාවය සම්බන්ධයෙන් මහ බැංකුවේ මතය හා අමාත්‍යවරයාගේ මතය අතර ගැටුමක් ඇති අවස්ථාවක අමාත්‍යවරයාගේ මතය බලපැවැත්විය යුතු බවට ප්‍රතිපාදන සලසා තිබීම වැනි කරුණු රැසක් මත මුදල් නීති පනත යටතේ මහ බැංකුව ස්වාධීන ව කටයුතු කිරීමට හිමිකම් ලදුයේ නැත. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත (මහ බැංකු පනත) ක්‍රියාවට නැගෙන්නේ එවන් වකවානුවක් තුළ ය.

2023 සැප්තැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක වූ මහ බැංකු පනතේ 5 වන වගන්තියට අනුව නෛතික පුද්ගලභාවයක් සහිත මහ බැංකුව පරිපාලනමය හා මූල්‍ය ස්වාධීනත්වයකින් යුතු ආයතනයක් වන අතර මහ බැංකුව, එහි පාලක මණ්ඩලය, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, එහි සේවකයන් කිසිවෙකුගේ බලපෑමට යටත් නොවිය යුතු බවත්, වෘත්තීමය කාරණාවක් සඳහා හැර මහ බැංකුව කිසිවෙකුගේ උපදෙස් නොපැතිය යුතු බවට වන සීමා පනවමින් මහ බැංකුවට සිය ඉතිහාසයේ ප්‍රථම වරට ව්‍යවස්ථාපිතව ප්‍රබල ස්වාධීනත්වයක් මෙම පනත මගින් උරුම කොට දී තිබේ. මේ වන විට යම්තාක් දුරකට හෝ මෙවන් පරිපාලනමය ස්වාධීනත්වයක් ව්‍යවස්ථාපිත ව ලබා දී ඇත්තේ ජාතික විගණන කොමිසම වෙත හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත පමණි[9].

මහ බැංකුවට සිය ඉතිහාසයේ ප්‍රථම වරට ව්‍යවස්ථාපිතව ප්‍රබල ස්වාධීනත්වයක් මෙම පනත මගින් උරුම කොට දී තිබේ. මේ වන විට යම්තාක් දුරකට හෝ මෙවන් පරිපාලනමය ස්වාධීනත්වයක් ව්‍යවස්ථාපිත ව ලබා දී ඇත්තේ ජාතික විගණන කොමිසම වෙත හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත පමණි.

ඉහත කී මහ බැංකු පනතේ 5 වන වගන්තියට අනුව මහ බැංකුව වෙත ලබාදුන් පරිපාලනමය හා මූල්‍ය ස්වාධීනත්වය මහ බැංකු පනත පුරා ම දැක්වෙන වගන්ති රැසකින් වඩාත් ශක්තිමත් කරනු ලබ යි. මෙහි දී මහ බැංකුවට රජයේ පොදු ආර්ථික ප්‍රතිපත්තියට සහාය දීම සිදු කළ හැකි වන්නේ ද 6 වන වගන්තියේ දැක්වෙන සිය මූලික හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුණුවලට අගතියක් සිදු නොවන්නේ නම් පමණි[10]. ඒ අනුව ආණ්ඩුකරණයේ දී රජයක් විසින් ගනු ලබන ජනප්‍රිය ආර්ථික හා දේශපාලන තීරණවලට අවශ්‍ය මූල්‍යනය සිදු කිරීම සිය මිල ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය නිර්ණායක නොතකමින් සිදු කිරීමට මෙම පනත යටතේ මහ බැංකුවට හැකියාවක් නොපවතී.

මෙම පනතේ ආයතනික ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති තවත් එක් පියවරක් වන්නේ සමායතන මූලධර්මයන්ගෙන් සපිරි සංවරණ හා තුලන ක්‍රමයක් යටතේ මහ බැංකු අධිපතිවරයා, පාලක හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයන්ගේ (පත්කළ සාමාජිකයින්) පත්කිරීම් සහ පහකිරීම් අනුමත කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් වීමය[11]. එසේම ඔවුන් එකී ධුරවලට සුදුසු හා යෝග්‍ය යන වග නිර්ණය කිරීම සඳහා වන අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම් ද ඇතුලුx පුළුල් නිර්ණායක ද මහ බැංකු පනතේ ගැබ් ව පවතී. පත් කළ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික තීරණය කිරීම මුදල් අමාත්‍යවරයා විසින් සිදු කළ ද ඒ සාමාජිකයින් ගේ ධුර කාලය තුළ එකී පාරිශ්‍රමික අඩු කළ නොහැකි බවට මහ බැංකු පනතේ ප්‍රතිපාදන සලසා තිබේ[12].

මෙරට මුදල් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ගත් කල, මහ බැංකු පනතේ ඇති සුවිශේෂී බව වනුයේ මුල් වරට මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීමේ හා දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම හා පවත්වාගෙන යෑම

---

9. ජාතික විගණන පනතේ හා දූෂණ විරෝධී පනතේ ප්‍රතිපාදන ප්‍රකාර ව එම ආයතනවලට පරිපාලනමය විනා මූල්‍ය ස්වාධීනත්වයක් නැත.

10. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 6(3) වගන්තිය සහ 104 වගන්තිය.

11. එම පනතේ 15 වන වගන්තිය.

12. එම පනතේ 21 වන වගන්තිය

පිණිස ව්‍යවස්ථාපිත ව හඳුනාගත් නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුවක් හඳුන්වා දීමයි. මෙහි දී මහ බැංකුව විසින් ළඟා කර ගත යුතු උද්ධමන ඉලක්ක රාමුව පිළිබඳ වන ගිවිසුමක් මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අත්සන් කළ යුතු වේ[13]. ඒ අනුව ගත් කල, උද්ධමන ඉලක්කය තීරණය කිරීමේ ස්වාධීනත්වයක් ශ්‍රී ලංකා මහ බැංකුවට නොපවතී. එහෙත් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සහ ඒ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ උපකරණ අවශ්‍ය පරිදි සකසා ගැනීමට අවශ්‍ය අධිකාරී බලය මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සතුවන බව මහ බැංකු පනතේ දැක්වේ[14]. ඒ අනුව ගත් කල, ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් ප්‍රතිපත්ති උපකරණ අභිමතානුසාරී ව භාවිත කිරීම සඳහා වන ස්වාධීනත්වය මහ බැංකු පනතින් සාක්ෂාත් කර ඇති බව පෙනී යයි.

මහ බැංකුවේ පරිපාලනමය ස්වාධීනත්වය සාක්ෂාත් වන පරිදි මහ බැංකු පනතින් ඉඩ සලසා ඇති ප්‍රතිපාදන වන්නේ සිය කාර්යය හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත බඳවා ගැනීමටත් ඔවුනගේ සුභ සාධනය උදෙසා විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල් ඇතුළු පාරිශ්‍රමික තීරණය කිරීමේ බලය මහ බැංකුවේ පාලක මණ්ඩලය වෙත ලබා දී තිබීමයි[15]. එසේම මූල්‍ය ස්වාධීනත්වය සාක්ෂාත් කරමින් මහ බැංකුවේ පාලක මණ්ඩලය වෙත බැංකුවේ අයවැය අනුමත කිරීමේ බලය පවරා ඇති අතර[16] මූල්‍ය ප්‍රකාශ විගණනයෙන් අනතුරුව මහ බැංකුවේ වත්කම් එහි මුදල් බැරකම් හා ගෙවා නිමි ප්‍රාග්ධනයේ එකතුවට වඩා අඩු වන අවස්ථාවක ආණ්ඩුවේ මූල්‍ය තත්ත්වය අනුව එකී පරතරය පියවිය නොහැකි අවස්ථාවක මහ බැංකුවේ ඉතිරිව පවතින බෙදාහැරිය හැකි ඉපයීම්වලින් ඒකී ප්‍රාග්ධන පරතරය පියවිය හැකි බවට මහ බැංකු පනතේ ප්‍රතිපාදන සලසා තිබේ[17].

මහ බැංකු පනතේ 5 වන වගන්තිය හැරුනු කොට එමගින් සළසා ඇති තවත් ප්‍රධානතම ප්‍රතිපාදනයක් වන්නේ ආණ්ඩුව වෙනුවෙන් අරමුදල් සම්පාදනයට ඇති දැඩි සීමා වේ. මෙම ප්‍රතිපාදන මගින් මහ බැංකුව රාජ්‍ය පිස්කල් ප්‍රතිපත්තියේ ග්‍රහණයට නතු වීම වළකා ඇති අතර ආණ්ඩුවේ මූල්‍ය හිඟය මහ බැංකුවේ අරමුදල්වලින් පියවා ගැනීමට ඇති ඉඩකඩ වළකා දමයි. ඒ අනුව, මහ බැංකුවට ඍජු ව හෝ වක්‍ර ව ආණ්ඩුව වෙත හෝ ආණ්ඩුවට අයත් පොදු අධිකාරියක් වෙත හෝ වෙනත් යම් රාජ්‍ය අස්ථිත්වයක් වෙත ණය ප්‍රදානය කළ නොහැකි ය[18]. එසේ ම, මහ බැංකුව වෙත පවතින තවත් සීමාවක් වන්නේ ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව සතු යම් අස්ථිත්වයක් විසින් හෝ වෙනත් යම් අස්ථිත්වයක් විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිලට ගැනීමට හැකියාව ලැබෙන්නේ ඉතාමත් ව්‍යතිරේඛී අවස්ථාවල දී හා දැඩි සීමාවලට යටත් ව පමණක් බවයි.[19]

තව ද ශ්‍රී ලංකා මහ බැංකුව සිය අරමුදල් භාවිත කරමින් සිදු කරන ලද විවිධ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම හා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම සියල්ලක් ම ආණ්ඩුවේ අරමුදල්වලින් පමණක් ම සිදු කළ යුතු බවට[20] වන සීමාකාරී ප්‍රතිපාදන මගින් ද රටට අවශ්‍ය ප්‍රමාණයට වඩා මුදල් සැපයුම සිදු කිරීම මගින් ආණ්ඩුව සමග එළැඹුණු ගිවිසුම ප්‍රකාර ව උද්ධමන ඉලක්කය අත්පත් කර ගැනීමට බාධාකාරී වන හෙයින් මහ බැංකුව විසින් සිදුකරන අරමුදල් සම්පාදනය සිය මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට පමණක් සීමාකොට එහි ස්වාධීනත්වය ආරක්ෂා කොට තිබේ. මේ සම්බන්ධයෙන් තවදුරටත් විශ්ලේෂණය කළහොත් මුදල් නීති පනත තුළ මෙන් නොව මහ බැංකුවට ආණ්ඩුවේ ඒකාබද්ධ අරමුදලින් මුදල් වර්ෂයක පළමු මාසය තුළ දරනු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීමට ඍජු තාවකාලික අත්තිකාරම් පිරිනැමිය හැකි වන්නේ ද ඉතාම සීමාකාරී කොන්දේසීන්ට[21] යටත්ව වන අතර එහි දී එම සෑම අත්තිකාරමක් ම මාස 6 කට නොවැඩි කාලයක දී වෙළෙඳපොළ ආශ්‍රිත පොලී අනුපාතිකයකට යටත් ව ගෙවා නිම කළ යුතු වේ. එසේ ම, මහ බැංකුවට ආණ්ඩුවේ නියෝජිතයා ලෙස ආණ්ඩුවේ සුරැකුම්පත් නිකුතුව හා ණය කළමණාකරණය සිදු කළ හැකිවන්නේ ද රාජ්‍ය ණය කලමණාකරණ ඒජන්සිය

13. එම පනතේ 26 වන වගන්තිය
14. එම පනතේ 5 වන කොටස
15. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 23 වන වගන්තිය
16. එම පනතේ 8(5) උප වගන්තිය සමග කියවිය යුතු 100 වන වගන්තිය
17. එම පනතේ 13 වන වගන්තිය
18. එම පනතේ 86 (1) උපවගන්තිය මෙම තහනම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපකරණයක් වන නිත්‍ය ණය පහසුකම සම්බන්ධයෙන් හෝ අවසන් ණය දෙන්නා ලෙස මහ බැංකුවට ඇති හදිසි ණය පහසුකම විෂයෙහි ද අදාළ නොවේ.
19. එම පනතේ 86 (4) උපවගන්තිය
20. එම පනතේ 87 වන වගන්තිය
21. එම පනතේ 127 වන වගන්තිය

හෝ කාර්යාලය පිහිටුවන නීතිය ක්‍රියාත්මක වන තෙක් පමණි.[22]

මේ සියලු සීමා කිරීම් සඳහා අන්තර්කාලීන විධිවිධාන මගින් යම් ආකාරයක ලිහිල් බවක් ලබා දී ඇති අතර එමගින් ප්‍රජාතාන්ත්‍රවාදී ව බලයට පත් වූ කිසිදු ආණ්ඩුවක් ඌන දුවශීලතාවකට පත් කිරීම මගින් එම ආණ්ඩුවට රටේ පොදු ජනතාව විෂයයෙහි වන මහජන භාරය උල්ලංඝණය කිරීමට ඉඩක් මෙකී ස්වාධීනත්වය හරහා ලබා දී නැති බව ද කිව යුතු වේ[23].

මහ බැංකු ස්වාධීනත්වය සමග අත්වැල් බැඳගන්නා ආනුෂංගික කාරණා කවරේ ද?

අර්ථ ශාස්ත්‍රඥ Friedman ට අනුව පුළුල් අභිමතයක් සහිත ස්වාධීන විද්වතුන්ගෙන් සැදුම්ලත් මහ බැංකුවක් පැවතීම රටකට නිසි පිලියමක් නොවේ. ඔහුට අනුව මෙකී අභිමතය ව්‍යවස්ථාදායකයේ මැදිහත්වීම මත මහජන පාලනයට යටත් ව පැවතිය යුත්තකි. වත්මන් සන්දර්භය තුළ මහ බැංකු ස්වාධීනත්වය යනු දේශපාලනික මැදිහත්වීමකින් තොර ව දේශපාලනික අධිකාරිය ඇතුළු අනෙකුත් වගකිවයුතු පාර්ශවයන් විසින් නිර්ණය කරන ලද උද්ධමන ඉලක්ක කරා ළඟා වීමට ඇවැසි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට මහ බැංකුවකට අවශ්‍ය අභිමතය වුවත් එය දැඩි වගවීමකට හා විනිවිදභාවයකට යටත් ව ක්‍රියාවට නැංවිය යුතු බව මින් අදහස් වේ. එම නිසා, වගවීම හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී ඇති විනිවිදභාවය මහ බැංකු ස්වාධීනත්වය සමඟ අත්වැල් බැඳගන්නා ප්‍රබල ආනුෂංගික කාරණා ලෙස සැළකේ[24].

ඒ හා සමාන ව ම මහ බැංකුවක පාලන අධිකාරිය හා මුදල් ප්‍රතිපත්තිය තීරණය කරන විද්වතුන් පත්කිරීම් යහපාලන මූලධර්ම, සංවරණ හා තුලන ක්‍රමවේදයන්ට යටත් ව සිදු කිරීම හරහා එකී විද්වතුන් හා ඔවුන් ගන්නා මිල ප්‍රතිපත්ති තීරණ කෙරෙහි මහජන විශ්වාසය ඇතිවීම නොවැළැක්විය හැකි වන අතර එමගින් මහ බැංකු ප්‍රතිපත්ති අසාධු ලෙස අර්ථනිරූපනයන්ට ලක්වීම වැළකේ. එනිසා යහපාලන මූලධර්ම හා ක්‍රමවේදවලට යටත් ව සිය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකිවන ආකාරයේ නෛතික පරිසරයක් පැවතීම ද මහ බැංකු ස්වාධීනත්වය සමඟ තිබිය යුතු මූලිකාංගයක් ලෙස වත්මන් ලෝකය හඳුනා ගනී. මීට පරිබාහිර ව, රටක පුරවැසියන්ට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය ව්‍යවස්ථාපිත ව සාක්ෂාත් කිරීම හරහා ද[25] පොදු අධිකාරියක් වශයෙන් මහ බැංකුවක් ගන්නා තීරණ රටක පුරවැසියන්ට දැනගත හැකි වීම නිසා රටේ පොදු යහපතට අගතිදායක විය හැකි හෝ විනිවිදභාවයෙන් තොර ව ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් තීරණ ගැනීමෙන් මහ බැංකුව වළකාලන අතර එමගින් එකී තීරණ හා මෙහෙයුම් කෙරෙහි මහජන විශ්වාසය ඇතිවීම මගින් පක්ෂ විපක්ෂ දේශපාලන අධිකාරීන් ට එකී "පොදු යහපත" යන ලේබලයට මුවා වී මහ බැංකුවට කළ හැකි අනිසි මැදිහත්වීම් වළකාලයි.

මහ බැංකු පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව, මහ බැංකු අධිපතිවරයා, පත් කළ සාමාජිකයින් හා නියෝජ්‍ය අධිපතිවරුන් පාර්ලිමේන්තුවට වගවිය යුතු වන අතර[26] උද්ධමන ඉලක්ක රාමුව පිළිබඳ වන ගිවිසුම හා එහි සමාලෝචනයන් වේ නම් ඒවා ද ඇතුළුව ගැසට් පත්‍රයේ පළ කළ යුතු වන අතර සෑම මාස 6කට ම වරක් මහ බැංකුව විසින් ආර්ථිකයේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් ප්‍රසිද්ධ කොට එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු වේ.[27] තව ද මහ බැංකුව විසින් වාර්ෂිකව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ තක්සේරුවක් ද ප්‍රසිද්ධියට පත්කළ යුතු වේ.[28] තව ද, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සම්මත කරනු ලබන සියලු යෝජනා ඊට පදනම් වූ ආර්ථික දැක්ම පිළිබඳ පැහැදිලි කිරීමක් සමඟ ම ප්‍රසිද්ධියට පත් කළ යුතු වන අතර[29] මහ බැංකු පනතේ 86 වගන්තියේ දැක්වෙන තහනම නොතකමින් ප්‍රාථමික වෙළඳපොළෙන් සුරැකුම්පත් මිලට මිලට ගත්තේ වී නම් ඒ පිළිබඳව ද මහ බැංකුව විසින් මහජනතාව දැනුවත් කළ යුතු වේ.[30] මහ බැංකුවේ මූල්‍ය වාර්තා විගණකාධිපතිවරයා ගේ විගණනයට යටත් වන අතර එම විගණනයට ලක්වූ

22. එම පනතේ 132 වන වගන්තිය
23. එස් සී එෆ් ආර් 195/2022 සහ එස් සී එෆ් ආර් 212/2022 යන මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පිටු.97, 115
24. "A Fresh Look at Central Bank Independence" by Paul Wachtel and Mario I. Blejer, accessed via https://www.cato.org/cato-journal/winter-2020/fresh-look-central-bank-independence
25. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනත
26. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26 වන වගන්තිය
27. එම පනතේ 80 වන වගන්තිය
28. එම පනතේ 70 වන වගන්තිය
29. එම පනතේ 13(9) උපවගන්තිය
30. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 86(5) වන උපවගන්තිය

මූල්‍ය වාර්තා මහ බැංකුව විසින් පාර්ලිමේන්තුවට හා ජනතාවට ප්‍රකාශයට පත කළ යුතු වේ.[31] එසේම, මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සියලුම රීති, නියෝග හා විධාන ගැසට් පත්‍රයේ පළකළ යුතුවන අතර ඒ සම්බන්ධයෙන් පොදු රෙජිස්ටරයක් ද පවත්වාගෙන යා යුතු වේ.[32] මෙකී වගන්ති මගින් මහ බැංකුවේ ස්වාධීනත්වයට ආනුෂංගික ව වගවීමේ යාන්ත්‍රණය හා සිය මෙහෙයුම්වල පවතින විනිවිදභාවය මනාව සපථ කොට ඇති බව කිව යුතු ය.

නිමාව

2023 අංක 16 දරන මහ බැංකු පනතේ ප්‍රතිපාදන ඇසුරින් මේ වනවිට මහ බැංකුව අත්පත් කරගෙන ඇති ව්‍යවස්ථාපිත ස්වාධීනත්වයට පෙර සිට ම එය රජයෙන් ස්වාධීන වූ ආයතනයක් විය යුතු බවට රටෙහි උපරිමාධිකරණය විසින් ද පිළිගෙන තිබේ.[33] එහෙත් පූර්වගාමී මුදල් නීති පනතේ තිබූ ඇතැම් ප්‍රතිපාදන විවිධ හේතූන් මත අවභාවිතයට ගැනීම හේතුවෙන් මහ බැංකුව එහි කාර්ය හා කර්තව්‍ය විෂයයෙහි තීන්දු තීරණ ගැනීමට කිසිදු බලාධිකාරියක් නොතිබූ විවිධ පුද්ගලයන්ගේ දෘඪ ග්‍රහණයට නතු වූ බව සහ ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් වූ මෑත ඉතිහාසයේ විනිශ්චිත උපරිමාධිකරණ තීන්දු මගින් ද පිළිගෙන ඇති යථාර්ථයකි.[34] ඒනිසා ව්‍යවස්ථාපිත ව ලබා දී ඇති යම් ස්වාධීනත්වයක් වේ ද එහි අපේක්ෂිත ප්‍රතිඵල සිය මෙහෙයුම්වලින් ද ප්‍රතිරූපනය කිරීමට ශක්තියක් ඇති පරිපාලනයක් සෑම මහ බැංකුවක් සතු ව තිබිය යුතු ය. ගෝලීය වශයෙන් මහ බැංකුවල මෙහෙයුම් දෙස බැලීමේ දී පෙනී යන කරුණක් වනුයේ බොහෝ මහ බැංකු සිය ස්වාධීනත්වය පිළිබඳ තෘප්තිමත් වනුයේ බලයේ සිටිනා ආණ්ඩු සමග ගැටීමක් නොපවතින තාක් කල් පමණි. ව්‍යවස්ථා මගින් ම ඇතැම් ආර්ථික තීන්දු තීරණ ගැනීමේ බලය රටේ විධායකය හෝ ව්‍යවස්ථාදායකය වෙත හෝ පවරනු ලබන අවස්ථාවක අණ පනත් හරහා මහ බැංකුවක් ලබන ස්වාධීනත්වය හුදු නෛතික ප්‍රතිපාදනවලින් ඔබ්බට ගමන් නොකරයි. එහෙත් අවධාරණය කළ යුතු කාරණය වන්නේ හැකි තාක් දුරට මහ බැංකුවක් විසින් කරනු ලැබ ඇති කාර්යයන් අදාළ රටේ පොදු යහපත පිණිස ම වන්නේ යැයි ඔප්පු කිරීමට සමත් වන ආකාරයට එකී මහ බැංකුව විසින් කටයුතු කර තිබිය යුතු වීමයි. වෙනත් වචනවලින් කිවහොත් සාධාරණ මිනිසාගේ සංකල්පය තුළින් බැලීමේ දී යම් ප්‍රස්තුත කාරණයක් විෂයෙහි අදාළ මහ බැංකුව ඒ හා සමාන තත්ත්වයක/වාතාවරණයක පවතින වෙනත් මහ බැංකුවක් ක්‍රියා කරන ආකාරයට ක්‍රියා කළේ යැයි සපථ වන ආකාරයෙන් කටයුතු කොට තිබිය යුතු වීම යි.

වර්තමානය වනවිට මහ බැංකුවක ස්වාධීනත්වය මැනීමේ ජාත්‍යන්තර දර්ශක ලොව නිර්මාණය වී තිබේ. ප්‍රධාන වර්ගීකරණ හතරක් එනම්, මහ බැංකු අධිපතිවරයා ගේ තත්ත්වය, ප්‍රතිපත්ති සම්පාදනය, මහ බැංකු අරමුණු සහ ආණ්ඩුවට ණය දීමේ දී පවතින සීමා යනා දී කරුණු මත පදනම් ව මෙම දර්ශක නිර්මාණය වී ඇති අතර එමගින් ගෝලීය වශයෙන් මහ බැංකු අත්පත්කරගෙන ඇති ස්වාධීනත්වයෙහි තරම තක්සේරු කරයි.[35] ගෝලීය වශයෙන් මහ බැංකු සෑම විට ම පාහේ ආණ්ඩුවේ මූල්‍ය උපදේශකයා ලෙස කටයුතු කරන හෙයින් එකී භූමිකාව තුළ ක්‍රියා කරමින් මනා විනයගරුක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් රටක ඇති කරන්නේ වී නම් එය නෛතික ව ලබා දෙන ස්වාධීනත්වයටත් වඩා වක්‍රාකාර ව එහෙත් වඩාත් ප්‍රායෝගික ලෙස මහ බැංකු ස්වාධීනත්වය සාක්ෂාත් කිරීම උදෙසා මහඟු පිටු බලයක් වනු ඇති. අභ්‍යන්තරික ව ගත් කල, මෑත අතීතයේ සිදු වූවාක් මෙන් මහ බැංකුව සහ එහි තීන්දු තීරණ ප්‍රශ්න කිරීමට හා විවේචනය කිරීමට පුන පුනා බලා සිටින පොදු මාධ්‍ය හා දේශපාලකයින්ට ඒ සඳහා පුවත් මැවීම හැකි උපරිමයෙන් වලකා ලීමෙන්ද ඒ සඳහා වන විනිවිදභාවයෙන් යුත් තෘප්තිමත් සේව්‍ය-සේවක සබඳතාවයක් මහ බැංකුව තුළ ඇති කිරීමට ඊට වගවිය යුතු සියලු ම පාර්ශ්වයන් විසින් වග බලා ගැනීම ද මෙකී ස්වාධීනත්වය සාක්ෂාත් කිරීමට අභිප්‍රේරණයක් වීම නොඅනුමාන ය. ඉහත කී සියලුම කාරණා පදනම් කොට ගෙන සහ ශ්‍රී ලංකා මහ බැංකු පනතින් අන් කවර ආයතනයකටත් වඩා ඉතා ශක්තිමත් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති පරිපාලනමය හා මූල්‍යමය ස්වාධීනත්වය මහ පොළොවේ යථාර්ථයක් කිරීම එහි ප්‍රධාන හවුල්කරුවන් වන අප සැමගේ පරම යුතුකමක් වනු ඇත.■

31. එම පනතේ 99 වන සහ 101 වන වගන්ති
32. එම පනතේ 106 වන වගන්තිය
33. පට්ටිවිදාන එ. මුදල් මණ්ඩලය සහ තවත් අය 30.04.2000 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව
34. එස් සී එෆ් ආර් 195/2022 සහ එස් සී එෆ් ආර් 212/2022 යන මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පි. 11
35. https://doi.org$10.5089$9798400268410.001 accessed on 18.08.2025

ඩිජිටල් ගනුදෙනු

සරලයි, ක්ෂණිකයි, සුරක්ෂිතයි

අප ජීවත් වන ලෝකය ඩිජිටල්කරණයක් කරා පියනගන යුගයක අපේ රටේ රාජ්‍ය අංශයේත් පෞද්ගලික අංශයේත් දැඩි අවධානය මේ වනවිට ඩිජිටල්කරණය කෙරෙහි යොමු වෙලා තියෙනවා. ඉතින් මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ වාණිජ ක්ෂේත්‍රයේ අප සිදු කරනු ලබන ගෙවීම් කටයුතු ඩිජිටල් ක්‍රමයකට සිදු කිරීම අනිවාර්ය කටයුත්තක් බවට පත් වෙමින් තිබෙනවා. ඔබ දන්නවා ශ්‍රී ලංකාව තුළ සාක්ෂරතාව සියයට 90ක වගේ අගයක් ගන්නවා වුණාට ඩිජිටල් සාක්ෂරතාව තියෙන්නේ සියයට 63ක් වගේ ටිකක් අඩු අගයක. ඉතින් මෙවැනි පසුබිමක් තුළ ඩිජිටල් ගනුදෙනුවක් ආරක්ෂාකාරී ව සිදු කරන ආකාරය පිළිබඳ ව ඔබ ව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය කාංචනා අඹගහවිට මහත්මිය සහ එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂක ගිම්හාන් මොහොට්ටි මහතා සමග කළ සාකච්ඡාවකි මේ.

- කාංචනා මහත්මිය අපි මුලින් ම දැනගන්න කැමතියි කොහොමද මේ "ඩිජිටල්" කියන වචනය ගනුදෙනු සමග සම්බන්ධ වෙන්නේ කියලා? ඉන් පසු ව අපි දැනගනිමු මොකක්ද ඩිජිටල් ගනුදෙනුවක් කියන්නේ කියලා.

මේක ඉතා ම වැදගත් ප්‍රශ්නයක්. මේ දවස්වල අපේ එදිනෙදා කටයුතුවල දී අපිට ගොඩක් අහන්න ලැබෙනවා ඩිජිටල් කියන වචනය. ඩිජිටල් කියන්නේ අලුත් දෙයක් නෙමෙයි. මේකට අපි ඉස්සර සරල ව ව්‍යවහාර කළේ විද්‍යුත් කියලා. විද්‍යුත් ගනුදෙනු, නැත්නම් ඉලෙක්ට්‍රොනික කියන වචනෙත් අපි ඉස්සර පාවිච්චි කළා. ඉතින් අපි දන්නවා ඔය ඉලෙක්ට්‍රොනික කියන වචනේ එන්නේ e කියන වචනෙන්. දැන් අපි ඒ සියල්ලට ම ඩිජිටල් කියන වචනය පාවිච්චි කරනවා, මොකද ඩිජිටල් තාක්ෂණය තමයි මේකට යොදා ගන්නේ. එතකොට ඩිජිටල් තාක්ෂණය අනුව කරන, ඩිජිටල් තාක්ෂණය යොදාගෙන නැත්නම් විද්‍යුත් ක්‍රමයට සිදු කරන ගනුදෙනු අපි ඩිජිටල් ගනුදෙනු කියලා හඳුන්වනවා. දැන් එතකොට මොකක්ද මේ ඩිජිටල් ක්‍රමයකට ගනුදෙනුවක් කරනවා කියන්නේ? අපි සාමාන්‍යයෙන් ගනුදෙනුවක් කරනකොට කාසි හා නෝට්ටු භාවිත කරනවා. දැන් කාසි හා නෝට්ටු භාවිත නොකර ගනුදෙනු කරන්න අපිට අවස්ථාව

සැලසිලා තියෙනවා. උදාහරණයක් ලෙස චෙක්පතක් සලකමු. චෙක්පතකින් ගනුදෙනු කරද්දී එතන දී සියල්ල සිදුවන්නේ අත්හුරු ක්‍රමයට. චෙක්පත් ගනුදෙනුවක මුල් ම පියවරේ දී අප විසින් අතින් ලියූ හෝ මුද්‍රණය කළ චෙක්පතක් දීම තමයි සිදු වෙන්නේ.

ඩිජිටල් ක්‍රමයට ගනුදෙනු කරන්න වෙන ම උපකරණ තියෙනවා. අපි සිදු කරන්නේ ඩිජිටල් ගනුදෙනුවක් කියලා හඳුනාගන්න ලේසි ම ක්‍රමයක් තමයි ගනුදෙනුවක දී අපි විද්‍යුත් උපකරණයක් භාවිත කර ගනුදෙනුව කිරීම. උදාහරණයක් වශයෙන් අපි දන්නවා අපිට ගෙවීම් කාඩ්පත් තියෙනවා. බැංකු ගිණුමක් ආරම්භ කළොත් බැංකුවෙන් දෙනවා ඩෙබිට් කාඩ් පතක්. එතකොට මේකත් ඩිජිටල් උපකරණයක්. එය පාවිච්චි කරන්න අපි ඩිජිටල් පද්ධතියකට සම්බන්ධ වෙන්න ඕනේ. උදාහරණයක් විදිහට අපි කඩයකට ගියොත් ඔවුන් සතුව තිබෙන විකිණුම්පළ ගෙවීම් යන්ත්‍රයකට (POS Machine) සම්බන්ධ කරලා තමයි ඒ ගෙවීම කරන්නේ. නැත්නම් අපිට පුළුවන් අන්තර්ජාලය හරහාත් ඩිජිටල් ගනුදෙනුවක් කරන්න. හැමෝගෙම අතේ තියෙනවා ජංගම දුරකථනයක්. ඒවා එක එක ආකාරයේ ජංගම දුරකථන වුණත් සියලු ම ජංගම දුරකථන ඩිජිටල් උපකරණ. ඒ උපකරණ හරහාත් අපිට ඩිජිටල් තාක්ෂණයෙන් ගනුදෙනුවක් කරන්න පුළුවන්. එතකොට මේ ආකාරයෙන් වන ඕනෑ ම ගනුදෙනුවක්, තමන්ගේ ජංගම දුරකථනය හෝ අන්තර්ජාලය හරහා හෝ තමන්ගේ බැංකුවෙන් දීපු කාඩ්පතකින් හෝ ඒ ආදී උපකරණ රාශියකින් විද්‍යුත් පරිපථයකට සම්බන්ධ වෙන ඕනෑ ම උපකරණයකින් ඩිජිටල් ගනුදෙනුවක් කරන්න පුළුවන්.

- **කාංචනා මහත්මිය, ඔබ පැහැදිලි කරපු ඩිජිටල් ගනුදෙනු දැනටත් ශ්‍රී ලංකාව තුළ සිදුවෙන බව අපි දන්නවා. ශ්‍රී ලංකා මහ බැංකුව විදියට මේ ඩිජිටල් ගනුදෙනුවල වැදගත්කම ඔබ හඳුනා ගන්නේ කොයි විදිහට ද?**

ශ්‍රී ලංකා මහ බැංකුව වශයෙන් ඇයි අපි මේ ගැන කතා කරන්නේ කියලා පැහැදිලි කළොත් දැනට ජාත්‍යන්තර වශයෙන්, ගෝලීය ආර්ථිකය ඩිජිටල් ගනුදෙනු වෙත යනවා. ඒකට හේතුවක් තියෙනවා. ඒ තමයි අපි ඩිජිටල් ක්‍රමයෙන් ගනුදෙනු කරන කොට අපේ ඒ ගනුදෙනුවලින් අපට ලැබෙන ප්‍රතිලාභ වැඩියි. එයට හේතුව කාසි හා නෝට්ටු මගින් ගනුදෙනු කරන විට පාරිභෝගිකයායි, වෙළෙන්දායි එක තැන ඉන්න ඕනේ. අපි ඩිජිටල් ක්‍රමයට ගනුදෙනු කරන කොට මේක අවශ්‍ය නැහැ. ව්‍යාපාරිකයාට තමන්ගේ ගෙදර සිට වුණත් අන්තර්ජාලයට සම්බන්ධ වෙලා තමන්ගේ වෙළෙඳ දැන්වීම්වලින්, සමාජ මාධ්‍ය තුළින් තමන්ගේ භාණ්ඩ පිළිබඳ ව දැන්වීමෙන් පසු ව පාරිභෝගිකයාට මේක ලබා දෙන්න පුළුවන්. අපි දන්නවා අපි ව්‍යාපාරයක් කරන්නේ ආදායම් ඉපැයීමට. ඉතින් ආදායම් ඉපැයීමට ගෙවීමක් කරන්නේ නැතුව ව්‍යාපාරික කටයුත්තක් කරන්න බැහැ. ඉතින් ඩිජිටල් ගනුදෙනුවක් සිදු කරන විට පාරිභෝගිකයා ආසන්නයේ සිටීම ම අවශ්‍ය නැහැ. ඩිජිටල් ගනුදෙනු කරන විට අපිට රටේ ඕනෑ ම තැනක විතරක් නෙවෙයි ලෝකේ ඕනෑ ම තැනක ඉන්න පාරිභෝගිකයෙකුට භාණ්ඩ හා සේවා ලබා දීලා ක්ෂණික ව වුණත් ගෙවීම ලබා ගන්න පුළුවන්. ඉන්දියාව පහුගිය වසර තුළ ඉතා ශීඝ්‍ර විදිහට ඩිජිටල්කරණය වෙලා තියෙනවා. දැන් ඉන්දියාවේ පොඩි කඩේක වුණත් පෙට්ටි කඩේක වුණත් QR ඩිජිටල් ක්‍රමයෙන් තමයි මුදල් භාර ගන්නේ. ඒකෙන් එන ප්‍රතිලාභවලින් ව්‍යාපාර දියුණු වෙන්න පුළුවන්. ව්‍යාපාර දියුණු වෙනකොට මුළු ආර්ථිකය ම දියුණු වෙනවා. ඒ නිසයි අපි මේ විදිහේ දැනුවත් කිරීම්වලටත් සහභාගී වෙන්නේ. මෙහි ප්‍රතිලාභ ගොඩක් තියෙන නිසා.

- **මේ ප්‍රශ්නය ගිම්හාන් මහත්මයාට. අපට පැහැදිලි කරන්න පුළුවන් ද ව්‍යාපාරිකයෙක් විදියට කොහොමද මේ ඩිජිටල් ගනුදෙනුවලට ප්‍රවේශ වෙන්නේ සහ ඔවුන්ට එයින් අත්වෙන විශේෂ වාසි සහගත තත්ත්ව තියෙනවාද කියලා.**

ඔව්. මම මුලින් ම පැහැදිලි කරන්නම්, ව්‍යාපාරිකයෙක් ඩිජිටල් ගනුදෙනු පද්ධතියට ඇතුළත් වීමෙන් ඒ අයට තියෙන වාසි. එතකොට ඒ වාසි ගැන පැහැදිලි කළාම පුළුවන් මේ ඩිජිටල් ගනුදෙනු පද්ධතියට කොහොමද ඇතුළත් වෙන්නේ කියන එකට උනන්දුවක් හදා ගන්න. දැන් සාමාන්‍යයෙන් කාසි හා මුදල් නෝට්ටු භාවිත කරලා ව්‍යාපාරිකයෙක් ගනුදෙනු කරනකොට, එම පුද්ගලයාට තිබෙන අපහසුතා සඳහන් කළ විට ඩිජිටල් ගනුදෙනුවලට එන්න අවශ්‍ය ඇයි කියලා ඔහුට ඉබේ ම අදහසක් ගන්න පුළුවන්. උදාහරණයක් විදියට කාසි හා නෝට්ටුවලින් ගනුදෙනු කරනකොට ලාච්චුවක් එහෙම නැත්නම් සේප්පුවක් අනිවාර්යයයෙන් නඩත්තු කරන්න වෙනවා. තමන්ගේ ව්‍යාපාරික ස්ථානයේ එදිනෙදා ලැබෙන මුදල් පරිස්සමට තියා ගන්න ඕනේ. මේවා ආරක්ෂා කරන්න ඕනේ. එතකොට විශාල පිරිවැටුමක්

තියෙන ව්‍යාපාරයක් නම්, ඒකේ විශාල මුදල් ප්‍රමාණයක් දවසට එකතු වෙනවා. එවිට සේප්පුවක් තියාගෙන මේක පරිස්සම් කරන්න වෙනවා. ඊළඟට දවසේ එකතු වෙන මුදල් ටික සේවකයෙක් මගින් හෝ එහෙමත් නැත්නම් ව්‍යාපාරිකයා විසින් ම ඒ මුදල් ටික අරගෙන ගිහිල්ලා බැංකුවක තැන්පත් කරන්න වෙනවා බැංකුව වහන්න කලින්. අපි සාමාන්‍ය විදියට මේකට cash in transit කියලා කියනවා. අපි මේ මුදල් ටික තමන්ගේ ලාච්චුවෙන් අරගෙන බැංකුවේ සේප්පුවට යනකන් අතරමැද දී විශාල අවදානමක් තියනවා මේ මුදල් ටික අරගෙන යන්න කාලයකුත් ගතවෙනවා. ව්‍යාපාරයට යොදවන්න තියෙන අවධානය වෙනස් වෙන්න පුළුවන් සහ තමන්ගේ කාලය සහ ශ්‍රමය වෙනත් අනවශ්‍ය දේකට යොදවන්න වෙනවා. මෙන්න මේ සියලු දේවල් නවත්තගෙන ව්‍යාපාරයක් සම්පූර්ණයෙන් ඩිජිටල් පද්ධතියට ආවොත් ලාච්චුවක්වත් තියා ගන්න ඕනේ නැහැ. මෙහෙම ව්‍යාපාර ඕන තරම් තියනවා. සේප්පුවක්, ලාච්චුවක් හෝ ව්‍යාපාරය ඇතුළේ කිසිම කාසි හා නෝට්ටු සංචිතයක් පවත්වාගෙන යන්නේ නැති. අන්න ඒක තමයි ප්‍රධාන ම වාසිය.

අනෙක් වාසිය තමයි ඔන්ලයින් ක්‍රමය හරහා හෝ ඩිජිටල් ක්‍රමය හරහා හෝ තමන්ගේ පාරිභෝගිකයාට භාණ්ඩ හා සේවා ලබා දීලා මුදල් ලබා ගන්නකොට කෙලින් ම ව්‍යාපාරිකයාගේ බැංකු ගිණුමට තමයි මේ මුදල්, පාරිභෝගිකයාගේ ගිණුමෙන් යන්නේ. එතකොට ඔහු අවිධිමත් මූල්‍ය පද්ධතියේ සිට විධිමත් මූල්‍ය පද්ධතියට ඇතුළත් වෙලා ඉන්නවා. එතකොට ඔහුගේ බැංකුව සෑම විටම වාර්තාවක් සටහන් කර ගන්නවා. කොපමණ ගනුදෙනු ප්‍රමාණයක් වුණා ද, කොච්චර මුදල් ප්‍රමාණයක් ආවා ද, එතකොට ඔහුට තවත් ව්‍යාපාරික අවස්ථාවක් විවර වෙනවා. බැංකුවට ඔප්පු කරන්න පුළුවන් ඔහු කොච්චර ගනුදෙනු ප්‍රමාණයක් කළා ද මොන විදිහේ ව්‍යාපාරයක් ද කරන්නේ කියලා. ඒ හරහා ඔහුට පුළුවන් තමන්ගේ බැංකුවත් එක්ක තියෙන පාරිභෝගික සබඳතාව වැඩි දියුණු කර ගන්න. ඔහුට බැංකුවෙන් තමන්ගේ ව්‍යාපාරය තව තවත් දියුණු කරගන්න උදව් ලබා ගන්න පුළුවන්. වෙනම ම ප්‍රකාශ කරන්න ඕනේ නැහැ. ලේසියෙන් ම බැංකුවත් ව්‍යාපාරිකයාත් අතර සබඳතාව වැඩි වීම තුළින් තව තව ව්‍යාපාරික අවස්ථා පුළුල් කර ගන්න ඔහුට බැංකුවේ සහාය ලබා ගන්න පුළුවන්. ඒ වගේ ම තමයි තවත් කාරණාවක් තියෙනවා. දැන් ශ්‍රී ලංකාව ගත්තොත් ඩිජිටල් උපකරණ පාවිච්චි කරන පුරවැසියන් ගණන ඉතා ම ඉහළ යි. අපි දැන් උදාහරණයක් විදියට කීවොත් ලංකාවේ පුරවැසියන් ගාව මේ වෙනකොට තියනවා මිලියන 21.3ක් විතර ඩෙබිට් සහ ක්‍රෙඩිට් කාඩ්පත්. ඒ වගේම බොහෝ දුරට හැම කෙනෙක් ළඟ ම ඩිජිටල් උපකරණයක් විදියට තමන්ගේ ජංගම දුරකථනය තියෙනවා. මේ සියලු ම දෙනාට ඩිජිටල් ගනුදෙනුවක් කරන්න සුදුසුකම් සහ අවශ්‍ය පහසුකම් තියෙනවා. එතකොට ඩිජිටල් ගනුදෙනුවක් කරන විට ව්‍යාපාරිකයාට කාසි හා නෝට්ටුවලින් ගනුදෙනු කරනවාට වඩා මේ ඉන්න සියලු ම පාරිභෝගිකයන් ව තමන්ගේ ව්‍යාපාරයට ආකර්ෂණය කර ගන්න පුළුවන්.

මේවා තමයි ප්‍රධාන වශයෙන් තිබෙන වාසි. මම මේ පැහැදිලි කළේ ඩිජිටල් ගනුදෙනු පද්ධතියට ඇතුළත් වෙන එකෙන් ව්‍යාපාරිකයකුට තියන වාසි. දැන් ආචාර්ය කාංචනා මහත්මිය පැහැදිලි කරයි ඩිජිටල් ගනුදෙනු පද්ධතියට කෙහොමද ව්‍යාපාරිකයකු ඇතුළත් වෙන්නේ මොන වගේ ක්‍රමවේද ද තියෙන්නේ කියන එක.

- **කාංචනා මහත්මිය, ඇත්තට ම කොහොමද ව්‍යාපාරිකයෙක් ඩිජිටල් ගනුදෙනු පද්ධතියට ඇතුළත් වෙන්නේ?**

අපි මුලින් ම හිතා ගන්න ඕනේ මොන ආකාරයේ ව්‍යාපාරයක් ද කරන්නේ සහ තමන්ගේ ව්‍යාපාරය කොච්චර ලොකුයි ද නැත්නම් මම තාම කුඩා ව්‍යාපාරිකයෙක්ද තමන් ස්වයං ව්‍යාපාරයක් විදියට ගෙදර ඉඳන් ද තමන්ගේ ව්‍යාපාරය කරන්නේ කියන එක. ඒ අනුව තමන් ඩිජිටල් ආකාරයෙන් මුදල් ලබා ගන්නා ක්‍රමය වෙනස් වෙනවා.

අපි මුලින් ම මහා පරිමාණ ව්‍යාපාර පිළිබඳ ව අවධානය යොමු කරමු. කුඩා පරිමාණ ව්‍යාපාර පිළිබඳ ව පසු ව සලකා බලමු. මහා පරිමාණයේ ව්‍යාපාරයක් ගත්තොත් දැන් අපි දන්නවා සමහර තොග වෙළෙඳ ආයතන තියෙනවා තවමත් ගනුදෙනු කරන්නේ කාසි හා නෝට්ටුවලින්. එතකොට ඒ ව්‍යාපාර කොහොමද ලේසියෙන් ඩිජිටල් ක්‍රමයට මුදල් ලබා ගන්නේ? ක්‍රම දෙකක් තියෙනවා. එකක් තමයි තමන්ට පුළුවන් කාඩ්පත් මගින් මුදල් ලබා ගන්න. ඒ විදිහට කාඩ්පත් ගනුදෙනුවලට යනවා නම් මුලින් ම ඔබ යන්න ඕනේ බලපත්‍රලාභී කාඩ්පත් අත්පත්කරුවෙකු වෙත. මේ බලපත්‍රලාභී කාඩ්පත් අත්පත්කරුවන් කියන්නේ මූල්‍ය ආයතන. දැන් ලංකාවේ ඉන්නවා ඒ අය 13 දෙනෙක්.

ඔබට ඒ ආයතන 13න් ඕනෑ ම එකකට ගොස් කියන්න පුළුවන් මම මගේ ව්‍යාපාරයේ ගනුදෙනු කාඩ්පත් මගින් සිදු කර ගන්න කැමතියි. ඒ සඳහා මට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කියලා. මෙහි දී තමන්ගේ ව්‍යාපාරයට ගැලපෙන ම විසඳුම දෙන ආයතනයෙන් කාඩ්පත් යන්ත්‍රය ලබා ගන්න. මේක තරගකාරී වෙළෙඳපොළක්. ඒ නිසා තමන්ට ගැලපෙන ආයතනයෙන් අවශ්‍ය සේවාව ලබා ගන්න පුළුවන්. එතන දී ඒ අවශ්‍ය උපකරණය ගන්න ගාස්තුවක් ගෙවන්න සිදු වෙනවා. නමුත් තමන්ගේ ව්‍යාපාරය ලොකු එකක් නිසා ඊට යන පිරිවැය වටිනවා. මොකද මුලින් ගිම්හාන් මහත්මයා පැවසූ ආකාරයෙන් තමන් විශාල මුදල් ප්‍රමාණයක් හුවමාරු කරනකොට ඒකේ හොරකම් සිදු වීමේ ප්‍රවණතාව වැඩියි. තමන්ට කෙලින් ම තමන්ගේ බැංකු ගිණුමට ම මුදල් ලබා ගැනීමට හැකි වීමෙන් තමන්ට මුදල් එහෙට මෙහෙට ගෙනියන්න, බැංකුවට ගිහිල්ලා තැන්පත් කරන්න යන වියදම සහ අවදානම් නැති වෙනවා.

තව ක්‍රමයක් තමයි තමන් විශාල ව්‍යාපාරයක් කරනවා නම් තමන් විශාල පරිමාණයෙන් ගනුදෙනු කරනවා නම්, තමන්ට පුළුවන් Online Banking භාවිත කරන්න. එතැන දී පුළුවන් තමන්ගේ සැපයුම් කරුවන්ට ඔන්ලයින් ක්‍රමයට ක්ෂණික ව මුදල් යවන්න.

දැන් අපි බලමු මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යාපාරය පිළිබඳ ව. තමන් හිතන්න ඕනේ තමන්ගේ ව්‍යාපාරයේ කොයි ආකාරයේ පාරිභෝගිකයන් ද ඉන්නේ. ඒ අයට කොහොමද ලේසියෙන් මේ ගෙවීම් කරන්න පුළුවන් කියලා සහ තමන්ට දරාගත හැකි සහ ගැලපෙන ක්‍රමය කුමක්ද කියලා. දැන් මෙතන තියෙනවා QR ක්‍රමය. QR කියන්නේ ඉතාමත් ම පිරිවැය අඩු ගනුදෙනු ක්‍රමයක්. ඔබට QR කේත ගෙවීම් පහසුකම ලබා ගන්න පුළුවන් මූල්‍ය ආයතන රාශියක් තියෙනවා ශ්‍රී ලංකාවේ. ඒ ඕනෑ ම ආයතනයකට ගිහිල්ලා කියන්න QR ක්‍රමයෙන් ගනුදෙනු කිරීමේ පහසුකම ලබා ගැනීමට අවශ්‍යයි කියලා. එතකොට තමන්ට ඒ ආයතනයෙන් QR ගනුදෙනු පහසුකම ලබා ගන්න පුළුවන්.

හිතන්න තමන් ගෙදරකට ගිහිල්ලා ටියුෂන් දෙන කෙනෙක් කියලා. ඒකත් කුඩා ව්‍යාපාරයක්. තමන් ගෙදර ඉඳන් කේක් හදන කෙනෙක් නම් ඒකත් පොඩි ව්‍යාපාරයක්නේ. ඒ අයට පවා ඉතා ම පහසුවෙන් තමන් සැපයූ සේවාවට QR කේතයෙන් මුදල් ලබා ගන්න පුළුවන්. ව්‍යාපාරය තිබෙන ස්ථානය, ඒ ව්‍යාපාරයේ ස්වාභාවය, ඒක විශාල පරිමාණයේ ව්‍යාපාරයක් ද? කුඩා ව්‍යාපාරයක් ද? නැතිනම් අලුතින් පටන් ගත්ත ව්‍යාපාරයක් ද? යන කරුණු අදාළ වෙන්නේ නෑ. මේ ආදී ඕන ම ව්‍යාපාරිකයෙකුට QR කේතය ලබා ගන්න පුළුවන්. ව්‍යාපාරයේ පරිමාණය කුමක් වුණත් QR එකෙන් ලක්ෂ පහක් වෙනකම් ක්ෂණික ව ගනුදෙනු කරන්න පුළුවන්. ඒ කියන්නේ එවෙලේ ම තමන්ගේ බැංකු ගිණුමට මුදල් බැර වුණාම, ඒ ගැන දැනුම් දීමට තමන්ට එනවා SMS එකක්. ඒ වගේ ම ඒ ගනුදෙනුවේ දී සේවා සපයන්නාට (තමන්ට) කිසිම උපකරණයක් අවශ්‍ය වන්නේ නැහැ. බැංකුවෙන් ඔබට පොඩි කාඩ්බෝඩ් එකක මුද්‍රිත QR කේතයක් නොමිලයේ ලබා දෙනවා. එතකොට ඒ නොමිලයේ හිමි වන QR කේතය තමන්ගේ වෙළෙඳසලේ ප්‍රදර්ශනය කර තැබීමයි කළ යුත්තේ. උදාහරණයක් විදිහට ගෙදර කේක් හදන කෙනෙක් නම් ගෙදරට ඒ කේක් වර්ග ගන්න එනකොට ඒ QR කේතය පෙන්නන්න පුළුවන්. පාරිභෝගිකයාට තමන්ගේ මොබයිල් ෆෝන් එකෙන් තමන්ගේ ඇප් එකකින් ගෙවීම් කරන්න පුළුවන්. QR කේතය මගින් ඉතාමත් ම සුළු අගයක සිට ලක්ෂ 5ක් වෙනකම් ගෙවීමක් කරන්න පුළුවන්.

තව විශේෂ දෙයක් තිබෙනවා. මෙරටට පැමිණෙන සංචාරකයන් ඇතුළු ඕනෑ ම විදේශිකයෙකුට LANKAQR කියන QR කේතයෙන් තමන්ගේ රටේ තියෙන ජංගම දුරකථන යෙදුවුමෙන් (ඇප් එකෙන්) ක්ෂණික ව තමන්ගේ රටේ තියෙන බැංකු ගිණුමෙන් ව්‍යාපාරිකයාගේ බැංකු ගිණුමට මුදල් එවන්න පුළුවන්. ඔබ සංචාරකයන්ට භාණ්ඩ හා සේවා සපයන ව්‍යාපාරයක් නම් ඔබට QR කේත ගෙවීමක් මගින් මේ සංචාරකයන්ගෙන් මුදල් ලබා ගන්න පුළුවන්. ඉතින් ඇත්තට ම මේ ආකාරවලින් ගෙවීම් කරන්න පෙර බලන්න ඕන මොකක්ද මගේ ව්‍යාපාරය? ඒකේ තත්ත්වේ කොහොමද? මට දරා ගන්න පුළුවන් ගාස්තු මොනවා ද? ඒ අනුව තමන්ට ගැලපෙන උපකරණය ලබා ගත යුතුයි. QR ක්‍රමයට කරන කොට ප්‍රාග්ධන වියදම් අවශ්‍ය නැහැ. අර මුද්‍රිත QR කේතය විතරයි අවශ්‍ය. ඒක නිසා ඕනෑ ම කෙනෙකුට පහසුවෙන් QR ක්‍රමයෙන් ගෙවීමක් කරන්න පුළුවන්.

තව එක ව්‍යාපාර කාණ්ඩයක් තමයි අන්තර්ජාලය හරහා ගනුදෙනු කරන ව්‍යාපාර. e-commerce මාර්ග යෙන් ගනුදෙනු කරනවා නම් එහිදීත් QR එකක් යවලා නැත්නම් තමන්ගේ වෙබ් අඩවියේ QR කේතය පෙන්නුම් කරලා මුදල් ලබා ගන්නත් පුළුවන්.

නැත්නම් තවත් ක්‍රමයක් තමයි, මූල්‍ය අත්පත්කරුවන් වන ආයතන 13න් එක් ආයතනයකට ගිහින් තමන් අන්තර්ජාලයෙන් ව්‍යාපාරය සිදු කරන බව දන්වා. ගනුදෙනු කරන ආකාරය විමසන්න. එවිට ඔවුන් ඊට අවශ්‍ය විසඳුම ලබා දෙනවා.

ඔබ දැන් දැනුවත් වුණා ඩිජිටල් ගනුදෙනුවක් කියන්නේ මොකක්ද? ඒ වගේ ම ව්‍යාපාරිකයෙක් විදියට කොහොමද මේ ඩිජිටල් ගනුදෙනුවලට යොමු වෙන්නේ කියන කාරණාව ගැන. කාංචනා මහත්මිය පැහැදිලි කළා කොහොමද QR කේතයකින් මේ ගෙවීම් කටයුතු සිද්ධ කරන්නේ කියන කාරණාව. මීට පස්සේ ඔබ වෙළෙඳසැලකට ගිහිල්ලා QR payment එකක් කරන්න බය වෙන්න ඕනේ නැහැ. ඔබ ව්‍යාපාරිකයෙක් නම් ඔබ අනිවාර්යයෙන් ම ඔබ ළඟට එන පාරිභෝගිකයාගෙන් අහලා දැන ගන්න LANKAQR හරහා එම ගෙවීම් කටයුත්ත සිද්ධ කරන්න පුළුවන් ද කියලා.

- **අපි දැන් දන්නවා ව්‍යාපාරිකයෙක් විදිහට කොහොමද මේ ඩිජිටල් ගනුදෙනු සඳහා යොමු වෙන්නේ කියන කාරණාව. කාංචනා මහත්මිය, පාරිභෝගිකයෙක් කොහොමද මේ ඩිජිටල් ගනුදෙනුවලට යොමු වෙන්නේ?**

අපි QR ගෙවීම් ගැන කතා කරමු. මොකද ඒක තමයි දැන් අපි ලංකාවේ හඳුන්වා දී ඇති නවතම ගෙවීම් ක්‍රමය. QR ක්‍රමයෙන් ගෙවන්න අපිට අවශ්‍ය වෙනවා ජංගම ගෙවීම් යෙදුමක් (ඇප් එකක්). ගෙවීම් ඇප් එකක්, නැත්නම් Payment App එකක්. මේක තමන්ගේ බැංකුවෙන් දෙන Banking App එක නෙවෙයි. Payment App එක බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් වෙන ම ලබා දෙනවා. අපට මේ ඕනෑ ම ඇප් එකක් පාවිච්චි කරන්න පුළුවන්. ඒ ඕනෑ ම ඇප් එකකට තමන්ගේ බැංකු ගිණුම, ඕනෑ ම බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ගිණුමක් සම්බන්ධ කරන්න පුළුවන්. මුලින් ම අපි මේ ඇප් එකට ලියාපදිංචි වෙන්න ඕනේ. ලියාපදිංචි වෙනකොට අපේ විස්තර දෙන්න අවශ්‍ය යි. ඉන් පසු ව ඒ අවශ්‍ය තහවුරු කිරීම් කළාට පස්සේ බැංකුව ලියාපදිංචි කර ගන්නවා. ඊට පස්සේ අපට තියෙන්නේ මේකට බැංකු ගිණුම සම්බන්ධ කර ගෙවීමක් කර ගන්න. නැත්නම් ඒකේ wallet එකක් තියෙනවා නම් ඒකට මුදල් එකතු කර (top-up කර) ගෙවීමක් කරන්නත් පුළුවන්. මේකේ තියෙන වාසියක් තමයි එහි දී භාවිත වෙන්නේ තමන්ගේ ප්‍රධාන ගිණුම නෙවෙයි. වෙන ම තියෙන wallet එකක්. ඒක හරියට අපේ ළඟ ඉලෙක්ට්‍රොනික් මුදල් පසුම්බියක් තියෙනවා වගේ වැඩක්. මෙමගින් තමන්ට පොඩි ආරක්ෂාවකුත් ලැබෙනවා.

අපි ඇප් එක බැලුවොත් තියෙනවා තවත් ගෙවීම් ක්‍රම කීපයක්. ඇප් එක භාවිත කරලා අපිට පුළුවන් අපේ ලයිට් බිල, වතුර බිල සහ වෙනත් ආයතන රාශියකට ගෙවීම් කරන්න. ඒ ආයතන යටතේ රජයේ ආයතන, පෞද්ගලික ආයතන සහ තවත් ගොඩක් ආයතන තිබෙනවා. ඒ ආයතන අපිට තෝරාගෙන, අපේ බැංකු ගිණුමෙන් ක්ෂණික ව ගෙවීම් කරන්න පුළුවන්. ඒ ආයතනවලින් නැවත බැංකු ගිණුම් අංකවත් වෙනත් විස්තරවත් අපට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ විස්තර ඇප් එකේ ගබඩා වෙලා තියෙන නිසා ක්ෂණික ව අපිට ඒ ගෙවීම කරන්න පුළුවන්.

- **ගිම්හාන් මහත්මයා අපට පැහැදිලි කරන්න, මේ ඩිජිටල් ගනුදෙනුවක් කරන එක ආරක්ෂාකාරී ද?**

ඔව් ඇත්තටම ආරක්ෂාකාරීයි. විශේෂයෙන් ම මුදල් භාවිත කරලා සිදු කරන ගනුදෙනුවලට වඩා ඩිජිටල් ගනුදෙනු බෙහෙවින්ම ආරක්ෂාකාරීයි. අපි දැන් කලින් කතා කළා මුදල් භාවිතයේ දී මොන වගේ අවදානම්වලට ද ලක් වෙන්නේ කියලා. මුදල් අරගෙන යනකොට ඒවා නැති වෙන්න පුළුවන්. අපි ඒ ගැන දැන් දැනුවත් වෙලා ඉන්නේ. ඩිජිටල් ගනුදෙනු කරන කොට පරිස්සමෙන් ගනුදෙනු කරේ නැත්නම්, වංචාවලට හසු වුණොත් ඔබේ මුදල් නැති වෙන්න පුළුවන්. හැබැයි එතකොට මං මේ ඩිජිටල් ගනුදෙනුවක් සිදු කරන නිසා මුදල් නැති වෙන්න පුළුවන් කියලා වැරදි අවබෝධයක් ලබා ගන්න හොඳ නෑ. එහෙම දෙයක් නැහැ. ලෝකයේ තියෙන සරල ම සුරක්ෂිත ම සහ වේගවත් ම ක්‍රමවේදය තමයි ඩිජිටල් ගනුදෙනු කියන්නේ. එතකොට සැකයක් තියාගන්න අවශ්‍ය නැහැ. ඔබ කාසි සහ නෝට්ටු චෙක්පත් වගේ දේවල් භාවිත කරනවාට වඩා බෙහෙවින් ම ආරක්ෂාකාරීයි ඩිජිටල් ගනුදෙනු කරන එක.

ඩිජිටල් ගනුදෙනු සිදු කරන කොට ඔබගේ මුදල් සම්බන්ධ කරුණු දෙකක් ගැන සැලකිලිමත් වෙන්න ඕනේ. එකක් තමයි ප්‍රවේසමෙන් ගනුදෙනු කිරීම. දෙවැනි එක තමයි ආරක්ෂාකාරී ව ගනුදෙනු කිරීම. ප්‍රවේසමෙන් ගනුදෙනු කරනවා කියන එක මං මුලින් විස්තර කරන්නම්. උදාහරණයක් විදිහට අපි කරන්නේ

ඔන්ලයින් මුදල් හුවමාරුවක් (fund transfer) නම්, මම මගේ බැංකු ගිණුමට ජංගම දුරකථනයක් හෝ ලැප්ටොප් පරිගණකයක් හෝ මොන ආකාරයෙන් හරි ඔන්ලයින් ක්‍රමවේදයට ප්‍රවේශ වෙලා ඩිජිටල් ක්‍රමවේදය හරහා මගේ ගිණුමෙන් වෙනත් ගිණුමකට මුදල් හුවමාරු කරලා යවනවා. එතකොට අපි ප්‍රවේසම් නොවුනොත්, උදාහරණයක් විදිහට මේ මුදල ලබන්නාගේ ගිණුම් අංකය අත්වැරදීමක් නිසා වැරදියට ඇතුළත් කළොත්, ඔහුගේ බැංකු ගිණුමේ විස්තර බැංකු ශාඛාව සහ බැංකුවේ නම මේ වගේ තොරතුරු අත්වැරදීමකින් වැරදියට ඇතුළත් කළොත් මේ අපි බලාපොරොත්තු වන ප්‍රතිඵලය ලබා ගන්න බැහැ. දැන් එතකොට ඔබ යවන ඔබගේ මුදල් වෙනත් අයෙක් අතට තමයි යන්නේ. අදාළ ගිණුමට ළඟා වෙන්නේ නැහැ. මෙතන දී අනියත සැකයක් තියා ගන්න ඕනේ නැහැ මම මේ ඩිජිටල් ගනුදෙනුව කළ නිසා තමයි මේ මගේ මුදල් නැති වෙන්නේ කියලා. බොහොම පහසුවෙන් සරල ව ඒ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න පුළුවන්. ඔබ යම්කිසි ඩිජිටල් ගනුදෙනුවක් හරහා ඩිජිටල් ක්‍රමවේදයක් හරහා මුදල් හුවමාරු කරනකොට ප්‍රවේශමෙන් මේ ගනුදෙනුව කරන්න ඕනේ. මුලින් ම ටික වෙලාවක් අරගෙන ගිණුම් අංකය හොඳින් පරීක්ෂා කරගන්න ඕනේ. මේ තමා විසින් මුදල් යැවිය යුතු පුද්ගලයාගේ ගිණුම ද කියලා නැවතත් පරීක්ෂා කරලා තහවුරු කරගන්න ඕනේ. වෙබ් අඩවියේ හෝ පරිගණක යෙදවුමේ හෝ ජංගම දුරකථන යෙදවුමේ කියන දේ අපැහැදිලිතාවයක් තියෙනවා නම් ඔබට පුළුවන් වෙනත් ක්‍රමයකින් අදාළ මුදල් ලබන්නා සම්බන්ධ කරගෙන ඔහුගෙන් නැවතත් ඒ තොරතුරු තහවුරු කර ගන්න. තහවුරු කරගෙන නිවැරදි ව අදාළ තොරතුරු ඇතුළත් කරලා තහවුරු කරලා මේ ගනුදෙනුව සිදු කළොත් අනිවාර්යෙන් ම 100%ක් සුරක්ෂිත ව ඔහුගේ ගිණුමට ඒ මුදල් ළඟා වෙනවා. ඒක තමයි පළමු වැනි කරණාව. ඩිජිටල් ගනුදෙනුවල දී සැලකිලිමත් ව ගනුදෙනු කිරීම ඔබගේ මුදල් ආරක්ෂා කර ගැනීම සඳහා වැදගත්.

අනික් කාරණාව තමයි ආරක්ෂාකාරී බව. ඔබ කොහොම ද ආරක්ෂා වෙන්න ඕනේ. මෙතන දී තමයි මේ ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත වංචා කියන එක ඩිජිටල් ගනුදෙනු අතරට එන්නේ. විවිධ වර්ගයේ වංචාකරුවන් අප අතර ඉන්න බව අප දන්නවා. අතීතයේ අපි කාසි සහ නෝට්ටු භාවිත කරනකොට ඔබගේ මුදල් පසුම්බි පැහැරගෙන යන, මග තොටේ දී ඔබගෙන් මුදල් සොරාගන්නා මිනිස්සු ඉන්නවා. ඒ වගේ දැන් ඩිජිටල් ගනුදෙනු සිදු කරන නිසා මේ ඩිජිටල් අවකාශයෙත් විවිධ වංචාකාරයෝ ඉන්නවා විවිධ ක්‍රමවේද උපක්‍රම අනුගමනය කරලා ඔබගේ ගිණුමේ තියෙන මුදල් සොරාගන්න බලාගෙන ඉන්න. එතකොට ඒවාට ආරක්ෂාකාරී පියවර විදිහට තමයි මුරපද කියන එක OTP හෙවත් One Time Password යනුවෙන් හැඳින්වෙන එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපද වැනි විවිධාකාර වූ ආරක්ෂාකාරී උපක්‍රම බැංකු පද්ධතිය සහ ඔබගේ සේවා සපයන්නා ඔබට ලබා දීලා තිබෙන්නේ. මේ සියලු ම උපදෙස් ඔබ හරියාකාර ව අනුගමනය කළොත් කිසිම කෙනෙකුට ඔබගේ ගිණුමේ තිබෙන මුදල් සොරා ගන්න හැකියාවක් නැහැ.

උදාහරණයක් විදිහට කිව්වොත්, ඔබගේ මුරපදය නැත්නම් Password එක, ඒ වගේම එක්වරක් පමණක් භාවිත කරන මුරපදය (OTP) වෙනත් තෙවන පාර්ශ්වයක් දුරකථන ඇමතුමක් දීලා ඉල්ලූ වෙලාවක අපි දෙවරක් නොසිතා නිදහසේ එය ඔවුන්ට ලබා දෙනවා නම් ඔබ ඒ කරන්නේ ඔබගේ ගිණුමට ඇතුළත් වෙන්න තියෙන ද්වාරයේ යතුර වෙන කෙනෙකුට ලබා දීම. එතකොට ඔවුන්ට පුළුවන් ඔබගේ ගිණුමට ඇතුළත් වෙලා ඔබගේ ගිණුමේ තියෙන මුදල් සොරා ගන්න. මෙයින් අදහස් වෙන්නේ නැහැ මෙය ඩිජිටල් ගනුදෙනු පද්ධතියේ තියෙන ප්‍රශ්නයක් හෝ ඩිජිටල් ගනුදෙනුවක් සිදු කිරීම අනාරක්ෂිතයි හෝ කියන එක. එයින් පෙන්නුම් කෙරෙන්නේ ඔබගේ නොසැලකිල්ල. ඔබ අන්සතු නොකළ යුතු දත්තයක්, තොරතුරක්, සංවේදි තොරතුරක් අන්සතු කිරීමේ දී ඔබ අවදානමට ලක් වෙනවා. එතකොට අපි අවධාරණය කරන්න ඕනේ, ඔබට ලැබෙන මුරපදය කිසි විටෙක අන්සතු කරන්න බැහැ. ඔබ යම්කිසි ගනුදෙනුවක් සිදුකරන්න උත්සාහ කරන කොට ඔබගේ බැංකුව විසින් ඔබගේ ජංගම දුරකථනයට හෝ ඊ මේල් ලිපිනයට එවන One Time Password හෝ OTP කියන එක්වරක් පමණක් භාවිත කළ හැකි මුරපදය වෙන කෙනෙක් සතු කරන්න ඕනේ නැහැ.

දැන් මෑතක දී අපිට වාර්තා වෙලා තිබෙනවා, මම මේ ඔබගේ බැංකුවෙන් කතා කරන්නේ ඔබට දැන් ලැබුණු OTP එක දෙන්න කියූ පසු සමහරු මේ බැංකුව කතා කරන නිසා බැංකුවට මේක දුන්නට ප්‍රශ්නයක් නැහැ කියලා හිතලා දීම. කිසිම අවස්ථාවක ඔබගේ මුරපද ඔබ හැර වෙනත් කිසිදු පාර්ශ්වයකට ලබා ගැනීම අවශ්‍ය නැහැ. ඒක දිය යුතු නැහැ. ඒ කියන්නේ බැංකුව කතා කරලා ඉල්ලුවත් අපි හිතමු මහ

බැංකුවෙන් කතා කරලා ඉල්ලුවත් ඒක අන්සතු කරන්න අවශ්‍ය කාරණාවක් නෙවෙයි. ඒක වැදගත්. ඒ වගේ ම ඔබට නොදන්නා අයගෙන් දුරකථන ඇමතුම් එන්න පුළුවන්. නොදන්නා අය ඔබගේ සංවේදී තොරතුරු ඉල්ලන්න පුළුවන්. ඒ වගේ අවස්ථාවල දී නැවතත් තහවුරු කරගන්න ඕනේ මේ මට සිදුකරන්න අවශ්‍ය ගනුදෙනුවක් ද? කියන එක. සරල ව කිව්වොත් ඔබගේ ජංගම දුරකථනයට OTP ගැන කියලා පණිවිඩයක් ආවොත් ඒ පණිවිඩය එන්නෙ ම ඔබගේ ගිණුමෙන් මුදල් අඩුවෙලා වෙනත් ගිණුමකට මුදල් යනවා කියන පණිවිඩයත් සමගයි. එතකොට ඔබ සැලකිලිමත් වීම අවශ්‍යයි ඔබ මේ වෙලාවේ ගනුදෙනුවක් කරන්න උත්සාහ කළෙත් නැතුව ඔබගේ Phone එකට OTP එකක් ආවා කියන්නේ වෙනත් කෙනෙකු හෝ වෙනත් තෙවන පාර්ශ්වයක් ඔබගේ ගිණුමේ මුදල් වෙනත් ගිණුමකට යවන්න උත්සාහ කරලා තිබෙනවා කියන එක ගැන. ඒ වෙලාවට ඔබ සැලකිලිමත් වෙලා ඔබගේ බැංකුව/මූල්‍ය ආයතනය හා සම්බන්ධ වෙලා මේ ගැන ඉක්මන් පියවරක් ගත්තොත් සහ මේ OTP සහ Password වෙනත් අයෙකු වෙත පත්වීම වළක්වා ගත්තොත් අතිශය ආරක්ෂිත ව ඕනෑම ගනුදෙනුවක් සිදු කරන්න පුළුවන්.

හරි අංකයට ද අපි මුදල් යවන්නේ කියලා හොඳින් පරීක්ෂා කළ යුතුයි. අපි මේ තහවුරුව කරන්න ඕනේ එක සැරයයි. ඊට පස්සේ ඒ ඇප්වල තියෙනවා ඒ ගිණුම් අංක සටහන් කර තබා ගැනීමේ පහසුකම. ඒ ගිණුම් අංකයට ප්‍රමුඛතාව දී තබාගන්න පුළුවන්. එක සැරයයි ඇත්තටම හරි ගිණුම් අංකය පරීක්ෂා කළ යුත්තේ. ඔබ නැවතත් එම පුද්ගලයාට හෝ එම ආයතනයට සල්ලි යවනවා නම් ඔබට ඒ ලැයිස්තුව භාවිත කරන්න පුළුවන්. අපිට ඉතාම පහසුවෙන් ඩිජිටල් ගනුදෙනුවක් කරන ආකාරය දැන ගත්තාම අපිට අපේ ජීවිතයේ ඒක සාමාන්‍ය දෙයක් බවට පත්වෙනවා. ඒක තමන් සාමාන්‍යයෙන් ගනුදෙනු කරන ක්‍රමය බවට පත් වෙනවා.

- **කාංචනා මහත්මිය, මේ සාකච්ඡාව අතරතුර මට අහන්න ලැබුණා යෙදුමක් LankaPay කාඩ්පත කියලා. මොකක් ද මේ?**

LankaPay කාඩ්පත කියන්නේ, ඩිජිටල් ගෙවීම් උපකරණවල අපේ ජාතික ගෙවීම් පද්ධතිය හරහා නිකුත් කරන ගෙවීම් උපකරණයක්. LANKAQR ගෙවීම් ක්‍රමයත් ජාතික ගෙවීම් පද්ධතිය හරහා තමයි සිදු වන්නේ. ඒ ගෙවීම වෙන්නේ පිටරට ගෙවීම් පද්ධතියක් හරහා නෙවෙයි. ඒ ගෙවීම වෙන්නේ දේශීය ව ලංකාවේ බැංකු හරහා. ඒ වගේම තමයි මේ LankaPay කාඩ්පත 2018 දී නිකුත් කරලා තිබෙන්නේ. එය දැන් බැංකු කිහිපයක් මගින් නිකුත් වෙනවා. අපි ඒක ප්‍රචලිත කරගෙන යනවා. මෙය ලංකාවෙ ම තියෙන ගෙවීම් පද්ධතියේ ක්‍රියාකරු විදිහට වැඩ කරන LankaPay ආයතනය මගින් මෙහෙයවෙන කාඩ්පත් ජාලයක්. ඒ ගෙවීම් වෙන්නේ දේශීය ව. එතකොට අපි පිටරටට මුදල් යවන්නේ නැහැ. සාමාන්‍ය කාඩ්පතක දී අපි පිටරටට ගාස්තු ගෙවීමක් වෙනවා ඒ ගෙවීම් සේවාවට. මේකේ විශේෂත්වය වෙන්නේ මේක දේශීය ව ම ක්‍රියාත්මක වෙන කාඩ්පතක් නිසා ඇත්තටම රටට ඉන් හොඳක් වෙනවා. ඒ කාඩ්පත්වලට හැකියාව තිබෙනවා පිටරටක ගෙවීම් කරන්නත්. ඒ කාඩ් එකට අපි International Network එකත් සම්බන්ධ කරලා තියෙන්නේ. තමන් පිටරට යනවා නම් පිටරට දීත් පාවිච්චි කරන්න පුළුවන්. විද්‍යුත් වාණිජ වෙබ් අඩවිවලත් පාවිච්චි කරන්න පුළුවන්.

- **අපි යම්කිසි රාජ්‍ය ආයතනයකට ඩිජිටල් ක්‍රමයකින් යම්කිසි ගෙවීමක් කරනවා නම් ඒක සිදුවන්නේ කොහොම ද කියලා අපි කාංචනා මහත්මියගෙන් දැනගමු.**

දැන් රජයේ ආයතන ඩිජිටල්කරණය සම්බන්ධ-යෙන් ලොකු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව රාජ්‍ය ආයතනවලටට දැන් ඩිජිටල් ආකාරයෙන් ගෙවීම් ලබා ගැනීමේ පහසුකම තිබෙනවා. ඒ කියන්නේ ඇප්ස්වලින් වගේ ම ඔන්ලයින් බැන්කින් ඒ කියන්නේ පරිගණකයෙන් අන්තර්ජාලය හරහා තමන්ගේ බැංකු වෙබ් අඩවියට පිවිසිලා ගෙවීම් සිදු කරන්න පුළුවන්. ඒ ආකාරයෙන් අපිට රාජ්‍ය ආයතනවලට ගෙවීම් කරන්න පුළුවන්. රේගු ගාස්තු ගෙවන්න පුළුවන්. බදු ගෙවන්න පුළුවන්. බැංකු ඇප් එකට ගියාම රාජ්‍ය ගෙවීම් (Government Payments) කියන තෝරා

ගැනීම (option එක) තියෙනවා. ඒක ඇතුළට ගියොත් පෙනෙයි රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදී ආයතන කිහිපයක්. ඇප් එකේ තවත් තිබෙනවා GovPay කියලා අංශයක්. ඒ හරහා තවත් 200කට අධික රාජ්‍ය ආයතනවලට ක්ෂණික ව ගෙවීම් කරන්න පුළුවන්.

"ක්ෂණික ව" කිව්වහම මෙතන තියෙන විශේෂත්වය තමයි අපි ගෙවීම කරනකොට අපි බද්දක් ගෙවනවා නම් අපේ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ ආකය (tin අංකය), රේගු ගාස්තුවක් ගෙවනවා නම් අපිට අදාළ අංකය, පළාත් සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට ගෙවීමක් කරනවා නම් ඒ අංකය යෙදූ විට ක්ෂණික ව අදාළ ආයතනයේ අදාළ අංකයට අපි ගෙවුවා කියලා සටහනක් වැටෙනවා. මේක තමයි ඒකේ තියෙන විශේෂත්වය. දවස් ගාණක් යන්නේ නැහැ ක්ෂණිකව ම ඒ සටහන ඒ ආයතනයට යොමු වනවා සහ ඒ ආයතනට ක්ෂණික ව මුදලුත් ලැබෙනවා. මේකෙන් රාජ්‍ය ආදායම ලබා ගැනීම පහසු සහ කාර්යක්ෂම වෙලා තිබෙනවා. හැමෝට ම කියන්නේ මේ පහසුකම් පාවිච්චි කරන්න. අදායම් එකතු කරන්නත් රාජ්‍ය ආයතනවලට ලොකු පිරිවැයක් යනවා. මෙමගින් එය මගහරවා ගන්න පුළුවන්.

මාර්ග නීති උල්ලංඝනය කිරීම් සඳහා ගෙවන්න වෙන දඩ මුදලුත් දැන් ක්ෂණික ව ම එම අවස්ථාවේ දී ම ගෙවන්න පුළුවන්. තැපැල් කාර්යාලයට යන්න අවශ්‍ය වන්නේ නැහැ. එතන දී ම ඒ දඩය ගෙවලා තමන්ගේ ගමන යන්න පුළුවන්. ඒ වගේ පහසුකම් ගොඩක් තියෙනවා. අපි ඩිජිටල් ක්‍රමවලට පිවිසුනහම මේ පහසුකම් ඔක්කොම අපිට ලබාගන්න පුළුවන්. App එක දාගන්න. ලියාපදිංචි වෙන්න. ඊට පස්සේ හරියට අවශ්‍ය ගිණුම් සම්බන්ධ කර ගත්තාට පස්සේ මේ සියලු පහසුකම් තමන්ට පාවිච්චි කරන්න පුළුවන්. අපි ගිණුම් අංක සේව් කරලා පහසුව ලබා ගන්නවා වගේ ම දැන් ගොඩක් ඇප්වල තිබෙනවා මොබයිල් අංකයට ඒ කියන්නේ ජංගම දුරකථන අංකවලට ගෙවීම් කරන්න පුළුවන් පහසුකම. PayMe කියලා තමයි ඒ පහසුකම තියෙන්නේ. ඒ අදාළ ලින්ක් එකට ගිය පසු අනෙක් පුද්ගලයාටත් තියෙනවා නම් පද්ධතියට සම්බන්ධ ඇප් එකක් ඒ ඇප් එක හරහා ක්ෂණික ව ඒ ලින්ක් එක යවන පුද්ගලයාට මුදල් එවන්න පුළුවන්. මේ වගේ නවෝත්පාදන රාශියක් ඩිජිටල් ගෙවීම් අවකාශයේ දැන් තිබෙනවා.

- **ගිම්හාන් මහත්මයා සඳහන් කළා ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත මූල්‍ය වංචා ගැන. ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත මූල්‍ය වාංචා සිදු වෙනවා ද? එහෙම සිදු වෙනවා නම් ඒ මොන වගේ ඒවා ද?**

ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත මූල්‍ය වංචා අපේ රටේ සිදු වෙනවා. හැමෝම ඩිජිටල් ගනුදෙනුවක් කරන කොට වංචාවට හසු වෙන්න පුළුවන් කියලා එයින් අදහස් වන්නේ නෑ. ලෝකේ වෙනත් රටවල්වලට සාපේක්ෂ ව බලපුවහම ලංකාවේ ඉතාම අඩු මට්ටමක තමයි එය තියෙන්නේ. ඩිජිටල් ගනුදෙනුවක් කරන විට ඕනෑම කෙනෙක් මූල්‍ය වංචාවකට හසුවෙන්න පුළුවන්.

මේ දිනවල ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගිකයන් වැඩිපුර ම හසුවෙලා තිබෙන ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත මූල්‍ය වංචා කිහිපයක් තිබෙනවා. පළමු වැනි එක තමයි වට්ස්ඇප් (Whatsapp) හෝ ටෙලිග්‍රෑම් (Telegram) ආශ්‍රිත වංචා. එකේ දී වෙන්නේ, ඔබ දන්නා පුද්ගලයෙකුගේ ඔබ හොඳින් හඳුනන පුද්ගලයෙකුගේ නිවැරදි දුරකථන අංකයෙන් ම වට්ස්ඇප් හෝ ටෙලිග්‍රෑම් කියන යෙදවුම් පාවිච්චි කරලා පණිවිඩයක් එන්න පුළුවන් "මට මේ ආකාරයේ පොඩි මුදල් හදිස්සියක් වෙලා තිබෙනවා. මේ මුදල හුවමාරු (transfer) කරන්න ඕනේ මෙන්න මේ බැංකු ගිණුම් විස්තරවලට. ඔබතුමාට හරි ඔබගේ නෑදෑ කෙනෙකුට හරි පුළුවන් ද මේ සල්ලි ටික දාන්න මම හෙට උදේ සල්ලි ටික ගෙනත් දෙන්නම්" කියලා. හැබැයි මේක එන්නේ දැන් විශ්වාස කරන්න පුළුවන් අංකයකින්. ඒ පුද්ගලයා මගේ වට්ස්ඇප් එකේ ඉන්න මගේ නෑදෑයෙක් වෙන්න පුළුවන්. නැත්නම් ළඟ ම හිතවතක් වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ජනප්‍රිය හෝ ප්‍රසිද්ධ චරිතයකින් වෙන්න පුළුවන්. මේ විදිහට මුදල් හුවමාරු කරන්න කියලා එන පණිවුඩ බහුතරයක් වංචාකරුවන් විසින් එවන පණිවුඩ. එතකොට ඔබට කුතුහලයක් ඇති වෙන්න පුළුවන් මම දන්න කෙනාගෙ ම දුරකථන අංකයෙන් මට කොහොමද වට්ස්ඇප් පණිවිඩයක් එන්නේ එයා නෙවෙයි නම් කියලා.

මෙතනදී අනාරක්ෂිත භාවයට ලක් වෙලා තිබෙන්නේ ඩිජිටල් ගනුදෙනු පද්ධතිය නෙවෙයි. ඒ අදාළ පුද්ගලයාගේ වට්ස්ඇප් ගිණුම හෝ ටෙලිග්‍රෑම් ගිණුම. ඒක හොඳින් මතක තියාගන්න ඕනේ. මේක මේ ඩිජිටල් පද්ධතිය ගැන අනවශ්‍ය බියක් ඇති කර ගන්න දෙයක් නෙවෙයි. ඔබ හඳුනන පුද්ගලයාගේ වට්ස්ඇප්

හෝ ටෙලිග්‍රෑම් ගිණුම අන්සතු වෙලා වෙන කෙනෙකු අතට පත් වෙලා වංචාකාරයා කුමන හෝ ක්‍රමයකින් ඔබට පණිවිඩයක් එවන්න ඒ ගිණුම පාවිච්චි කරනවා. උදාහරණයක් විදිහට ලංකාවේ ප්‍රසිද්ධ පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින් පණිවිඩ එවනවා ඔහුගේ දුරකථන අංකයෙන් නමුත් ඔහු නෙවෙයි.

එතකොට මේ විදිහේ පණිවිඩ එනකොට ඔබ හොඳින් මතක තබාගත යුතුයි මේ වට්ස්ඇප් පණිවිඩය එන්නේ ලංකාවේ තියෙන ඩිජිටල් ගනුදෙනු පද්ධතියේ තියෙන අනාරක්ෂිත බවක් නිසා නොවෙයි, අදාළ පුද්ගලයාගේ වට්ස්ඇප් හෝ ටෙලිග්‍රෑම් හෝ චැට් ඇප් එක කුමන හෝ ක්‍රමයකින් අන්සතු වෙලා, වංචාකරුවෙකු විසින් ඒ ගිණුම ඔහුගේ ග්‍රහණයට ලක්කර ගෙන නිසා බව. මේ දිනවල ලංකාවේ සරල ව ම සිදු කෙරෙන බොහෝ දෙනා හසුවන ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත වංචාවක් තමයි මේ වට්ස්ඇප් වංචා කියන්නේ. ඔබ මේ මුදල් යැව්වොත් බොහෝ දුරට එය වංචාකරුවෙකුගේ අතට පත්වෙන්න ඉඩ තියෙනවා.

එතකොට අනිවාර්යෙන් ම ඔබ සිදු කරන්න ඕනේ ඔබ දන්නා හඳුනන කෙනෙකුගෙන් මේ පණිවිඩය ගැන දෙවන මාර්ගයකින් ඒ කියන්නේ වෙනත් ක්‍රමයකින් වෙනත් දුරකථන අංකයකින් හෝ වෙනත් ක්‍රමවේදයකින් ඔහුව සම්බන්ධ කරගෙන තහවුරුවක් ලබා ගන්න ඇත්තටම ඔයා මගෙන් සල්ලි ඉල්ලුවා ද කියලා. ලංකාවේ ඕනේ තරම් ක්‍රම තියෙනවා. මම කියන්නේ මේ වට්ස්ඇප් අංකයටම දුරකථන ඇමතුමක් අරගෙන අහන්න කියලා නෙවෙයි. එතකොට සමහර විට වංචාකාරයාම මේ දුරකථන ඇමතුමෙන් කියන්න පුළුවන් මම තමයි කිව්වේ කියලා. වෙනත් දුරකථන අංකයකින් එහෙම නැත්නම් ඔහු ළඟ සිටින වෙනත් හඳුනන කෙනෙකුගෙන් අහන්න පුළුවන් ඇත්තට ම මගෙන් මෙහෙම මුදලක් ඔබ ඉල්ලුවාද කියලා. ඒ විදිහට ඉතාම සරල ව මේ වංචාවට හසුවන එක නවත්තගන්න පුළුවන්. ලංකාවේ දැන් මේක පාලනය කරලා තිබෙන්නේ. ඔබ සැලිකිලිමත් වෙන්න. විවිධ චැට් ඇප්වලින් විශේෂයෙන් වට්ස්ඇප් ටෙලිග්‍රෑම්වලින් ඔබට කවුරුහරි ඔබ දන්නා හඳුනන කෙනෙක් ලෙස පෙනී සිටිමින් මුදල් ඉල්ලුවොත් සැලකිලිමත් වෙන්න සොයා බලන්න ඉතා පහසුවෙන් මේ වංචාවෙන් ගැලවෙන්න පුළුවන්.

ඒ වගේ ම මේ දිනවල සිදුවනවා තවත් වංචාවක්. ඔයාගේ ජංගම දුරකථනයට එනවා කෙටි පණිවුඩ (SMS) හෝ වට්ස්ඇප් පණිවිඩ හරහා ලින්ක් එකක්. නිවසේ සිට පහසුවෙන් සල්ලි හොයන්න පුළුවන් මේ ලින්ක් එකෙ ක්ලික් කරලා ඉදිරි පියවර අනුගමනය කරන්න. අපි ඔයාට සල්ලි දානවා. ලින්ක් එක ක්ලික් කරලා එන ඇප් එක ඔබගේ ජංගම දුරකථනයට ඩවුන්ලෝඩ් කරගෙන ඉන්ස්ටෝල් කරගන්න. එතකොට අපි ඔබට මුදල් දෙනවා. මේ විදිහේ නොදන්නා ලින්ක් ක්ලික් කළොත් ඔබගේ ජංගම දුරකථනයේ පාලනය වංචාකරුවන් අතට පත්වන්න අවදානමක් තිබෙනවා. ඒ නිසා අපි උපදෙස් දෙන්නේ පිළිගත් සහ වරලත් ඇප් ස්ටෝර් එකකින් පමණක් ඔබගේ ජංගම දුරකථනයට අවශ්‍ය ගෙවීම් යෙදවුම (Payment App) එහෙම නැත්නම් ඔබට එදිනෙදා ප්‍රයෝජනයට අවශ්‍ය කරන ජංගම දුරකථන යෙදවුම් බාගත (download) කරගන්න. විවිධ අය විසින් එවන ලින්ක් හරහා ගිහින් ඔබගේ ජංගම දුරකථනයට මේ පේමන්ට් ඇප්ස් බාගත කරගන්න එපා.

ඒකෙ ම එක්තරා දිගුවක් විදිහට මේ දිනවල යනවා Task Scam කියලා. ඔබව දැන හඳුනන අය විදිහට වංචාකරුවන් විසින් ඔබට වාසියක් අත්වන විදිහට ඔබ සමග චැට් කරලා කෝල් කරලා අපි ඔබට පහසු ඉලක්කයක් දෙන්නම් මේ ඉලක්කය සම්පූර්ණ කර ගත්තාට පස්සේ යම්කිසි තෑගි මුදලක් ඔබට ලබා දෙනවා කියලා ඔබව පොළඹවනවා. යම්කිසි ඉලක්කයක් අසීරු ඉලක්කයක් ලෙස ඔබට හඟවමින් නමුත් සරල ඉලක්කයක් ලබා දෙනවා. මේක කරන්න තියෙන්නේ ඔන්ලයින්. ඒකට අපි කියනවා පළමු වැනි ටාස්ක් එක කියලා. මේක කරගෙන යනකොට ඔයා මේක කම්ප්ලීට් කරා ඔයාට මුදල් ත්‍යාගයක් තිබෙනවා ලබාගන්න. ඔයාට ලක්ෂයක් දෙනවා දෙකක් දෙනවා. ඒ ලක්ෂය හෝ දෙක දෙන්න අපි ළඟ යම්කිසි ගාස්තුවක් තැන්පත් කරලා ලියාපදිංචි වෙන්න කියනවා. මෙතනදිත් වෙන්නේ ඩිජිටල් ගනුදෙනුව ආශ්‍රිත කිසිදු වංචාවක් සහ ඩිජිටල් ගනුදෙනු පද්ධතියේ තියෙන අඩුපාඩුවක් නෙවෙයි. අපිව රවටලා අපි ලවා ම වංචාකරුවාගේ ගිණුමට මුදල් හුවමාරු කර ගන්න එක.

එතකොට විශේෂයෙන් ඔබට කවුරු හරි කියනවා නම් මෙන්න මෙහෙම ඉලක්කයක් (Task එකක්) දීලා මේක සම්පූර්ණ කළ පසු ඔබට ත්‍යාග මුදලකුත් ලැබෙනවා කියලා. ඒක අනිවාර්යෙන්ම වංචාවක් වෙන්න පුළුවන්. ඒ නිසා ඒ ගැන සැලකිලිමත් වෙන්න. ඒ වගේ ම වංචාකරුවන් මේ දවස්වල එකවුන්ට් මියුලින්, මනි මියුලින් කියලා ජාතියක් කරගෙන යනවා. විශේෂයෙන්

ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ ඒ වගේම ඩිජිටල් සාක්ෂරතාව යම්තාක් දුරකට තියෙන තරුණ ප්‍රජාව මේකට හසුකරගන්න උත්සාහ කරනවා. ඒකේදි වෙන්නේ ඔවුන්ගේ ගනුදෙනු සිදු කිරීම සඳහා ඔබගේ නමින් ගිණුමක් විවෘත කරගන්නවා. එතකොට ඔවුන් කියනවා ඔබගේ ගිණුම විවෘත කරන්න. අපි ඔබගේ ගිණුමට උදේ මුදල් දානවා. ඔබට තිබෙන්නේ බොහොම සරල කාරණාවක්. ඔබ ඒ මුදල් අපි කියන ගිණුම් අංක වෙත ඔන්ලයින් ක්‍රමයට හුවමාරු කරන්න කියලා. හැම ගනුදෙනුවකට ම අපි ඔයාට කොමිස් ගාස්තුවක් ගෙවන බවත් කියනවා. මේක බැලූ බැල්මට වංචාවක් නොවුනට මේක විශාල වංචාවකට ඔබව මැදිහත්කරු ලෙස යොදවා ගන්නා අවස්ථාවක්. ඒක නිසා දැනටමත් ඔබ කවුරුන් හෝ මේ විදිහේ ගනුදෙනුවක් සිදු කරනවා නම්. මේ වංචාකරුවන් සිදුකරන්නේ වෙන කෙනෙකුගේ ගිණුමෙන් වංචා සහගත ලෙස සොරා ගන්නා මුදල් ඔබගේ ගිණුමට බැර කරලා ඔබ ලවා එය තවත් පුද්ගලයින්ට හුවමාරු කරන එක. අන්තිමේ දී මේක නීතියේ රැහැනට හසුවන කොට මේ වංචාව සිදු කරපු කෙනා විදිහට හසුවන්නේ මේ මියුල් එකවුන්ට් එක එහෙම නැත්නම් මේ මැද ඉඳගෙන මුදල් හුවමාරු කරපු, කොමිස් මුදලට මුදල් හුවමාරු කරපු පුද්ගලයා. මේක තරුණ ප්‍රජාව, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් යොදා ගන්නා අවස්ථාවක්. ඩිජිටල් වංචාකරුවන් විසින් මේ වංචාව සැගවිලා සිදු කරලා ඔබ හරහා මුදල් වෙනත් ගිණුම්වලට හුවමාරු කරලා යවනවා. ඒක නිසා ඔබ අවධාරණය කරගන්න ඕනේ තමන්ට අයිති නැති මුදලක් තමන්ගේ ගිණුමට වැටෙනවා නම්, එහෙම නැත්නම් තමන්ගේ ගිණුම වෙනත් අයගේ ගනුදෙනු සඳහා යොදාගන්න කියලා තමන්ට ආරාධනාවක් ලැබෙනවා නම් ඒක අනිවාර්යෙන් ප්‍රතික්ෂේප කරන්න. ඔබගේ ගිණුමට නාඳුනන ගිණුමකින් මුදල් ලැබුණොත් බැංකුව දැනුවත් කරන්න. පොලිසිය සහ අදාළ ආරක්ෂණ ආයතන දැනුවත් කරන්න. දැනටමත් මේ විදිහට මියුල් එකවුන්ට එකක් පාවිච්චි කරන කෙනෙක් නම් වහාම මේක නවත්තලා ඔබගේ බැංකුව දැනුවත් කරන්න. ඒ වගේම අදාළ ආරක්ෂණ ආයතන දැනුවත් කරන්න. නීතිමය ක්‍රියාමාර්ග ලබා ගන්න.

මුලින් ම ඔබගේ අවදානමට ලක්වුණ ගිණුම අක්‍රීය කිරීමට බැංකුව දැනුවත් කරන්න. අදාළ ආරක්ෂක අංශය දැනුවත් කරන්න. පොලිසිය දැනුවත් කරන්න. ඊළඟට ෆින්සිසර්ට්, සර්ට් වැනි ආයතන සමග සම්බන්ධ වෙලා මේ පිළිබඳ ව තාක්ෂණික දැනුම අරගෙන කොහොම ද ඉදිරියේ දී මේවාට හසුවීම වළක්වා ගන්නේ කියලා දැනුවත් වෙන්න.

- **ඇත්තට ම ගිම්හාන් මහත්මයා යම් පුද්ගලයෙක් මූල්‍ය වංචාවකට හසු වෙලා නම් ඔහු මොකක්ද කළ යුත්තේ?**

ඒක තමයි වැදගත්ම ප්‍රශ්නය. දැන් වංචාවලින් ගැලවෙන විදිහ අපි දැනගත්තට පස්සේ මුලින් ම කරන්න ඕනේ ඔබ දැන් ඔබගේ වංචාවට හසුවුණා යැයි සැක සහිත ගිණුමක් තියෙනවා නම් බැංකුවේ ඒකේ තවදුරටත් යම්කිසි මුදලක් ඉතුරු වෙලා තිබෙනවා නම් ඒ මුදල් ආරක්ෂා කර ගැනීම. ඒක නිසා ඔබ වහාම ඔබගේ බැංකුව අමතලා මේ ගිණුම තාවකාලික ව අක්‍රිය කරන්න ඕනේ. ඊට පසු ව බැංකුව සමග සම්බන්ධ වෙලා ඔබ මේ වංචාවට හසුවුණේ කොහොමද කියලා ඔවුන්ට විස්තර කරලා යම්කිසි පැමිණිල්ලක් හරහා ඔවුන් දැනුවත් කරලා ඔවුන්ගෙන් තාක්ෂණික උපදෙස් ලබාගන්න ඕනේ. ඊට අමතර ව ඔබ හසුවුන වංචාව රුපියල් මිලියන 2ට අඩු නම් ළඟ ම තියෙන පොලිස් ස්ථානයට ගිහින් ඔබට පුළුවන් පැමිණිල්ලක් දාන්න. රුපියල් මිලියන 2ත් රුපියල් මිලියන 20ත් අතර ප්‍රමාණයක මුදල් වංචාවකට ඔබ හසුවෙලා තිබෙනවා නම් ඔබට පුළුවන් මූලස්ථාන පොලිසියකට ගිහින්, එතන සිටින සහකාර පොලිස් අධිකාරිවරයෙක් හමුවෙලා යම්කිසි නීති උපදෙසක් ලබාගෙන පැමිණිල්ලක් දාන්න. රුපියල් මිලියන 20කට වැඩි වටිනාකමක අලාභයක් ඔබට වෙලා තිබෙනවා නම් ඔබට පුළුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ පැමිණිල්ල යොමු කරන්න.

මේ නීතිමය කටයුතු කරන අතරතුර, මෙවැනි පරිගණක ආශ්‍රිත වංචාවලට හසු වුනහම ඔබට තාක්ෂණික දැනුම ලබා දීම සඳහා ලංකාවේ ආයතන කිහිපයක් තිබෙනවා. එක් ආයතනයක් තමයි Sri Lanka CERT ආයතනය. එතනින් කරන්නේ ඔබ පරිගණක වංචාවකට හසු වුනොත් ඔබට තාක්ෂණික

සහාය ලබා දීම. ඊටත් එහාට ගිහිල්ලා ඔබ හසු වී තිබෙන්නේ මූල්‍ය ගනුදෙනු හා සම්බන්ධ පරිගණක හෝ ජංගම දුරකථන වංචාවකට නම්, FinCSIRT කියලා ආයතනයක් තිබෙනවා ලංකාවේ ඔවුන් තමයි මේ මූල්‍ය අංශයේ සිදු වන වංචාවල දී ඒක ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිත වංචාවක් නම් ඊට තාක්ෂණික උපදෙස් ලබා දෙන්නේ. ඔබට පුළුවන් ඔවුන් ව සම්බන්ධ කර ගෙන මේ පිළිබඳ ව තාක්ෂණික උපදෙස් ලබා ගන්න. මුලින් ම ඔබගේ අවදානමට ලක්වුණ ගිණුම අක්‍රීය කිරීමට බැංකුව දැනුවත් කරන්න. අදාළ ආරක්ෂක අංශය දැනුවත් කරන්න. පොලිසිය දැනුවත් කරන්න. ඊළඟට FinCSIRT, Sri Lanka CERT වැනි ආයතන සමග සම්බන්ධ වෙලා මේ පිළිබඳ ව තාක්ෂණික දැනුම අරගෙන කොහොම ද ඉදිරියේ දී මේවාට හසුවීම වළක්වා ගන්නේ කියලා දැනුවත් වෙන්න.

- **කාංචනා මහත්මිය මේ වංචාවලට හසුවීමේ ප්‍රවණතාව ගත්තම ඊට විශේෂයෙන් හසු වන වයස් කාණ්ඩයක් හරි ප්‍රජාවක් හරි ඉන්නවාද?**

ශ්‍රී ලංකාවේ වංචාවලට හසුවන පුද්ගලයෝ බැලුවම අපට විශේෂ කාණ්ඩයක් කියලා වෙන් කරන්න බැහැ. හැම කොටසකින් ම වංචාවලට හසුවනවා. නමුත් ඔවුන් හසුවන වංචා වර්ග වෙනස්. දැන් අපිට ගොඩක් දකින්න ලැබෙනවා OTP වංචාවලට හසු වෙනවා ඩිජිටල් බැංකුකරණය ගැන කිසිදු දැනුමක් නැති අය. ඒ කියන්නේ සමහර අය හිතන්න පුළුවන් මම වයසයි මට ඩිජිටල් බැන්කින් අවශ්‍ය නැහැ මට ඔන්ලයින් දැනගන්න ඕනේ නැහැ කියලා.

හැබැයි තමන්ට බැංකු ගිණුමක් තිබෙනවා කියන්නේ තමන් ඒ පද්ධතියේ දැනටමත් ඉන්නවා. තමන් කැමති වුණත් නැති වුණත් තමන් ඒ පද්ධතියේ ඉන්නවා. තාක්ෂණික පද්ධති කියන්නේ සියලු ම දෙනාම ඒකට සම්බන්ධ වෙලා සිටින පද්ධති. එතකොට තමන් මේ ගැන නොදැනුවත්ව ඉන්නකොට සමහර විට කවුරුහරි කතා කරලා OTP එක ඉල්ලනවා. මොකද තමන් දන්නේ නැති වුණාට බැංකුව හිතනවා මේ පුද්ගලයා ඩිජිටල්කරණයට ඇවිල්ලා ඉන්නේ. මෙයා දැන් OTP එකක් ඉලල්ලා තියෙන්නේ. තමන් මේ ගැන දන්නේ නැත්නම් කවුරු හරි කතා කරලා OTP එක ඉල්ලුවොත් තමන් නොදැනුවත් ව දෙනවා. සමහර අයට ඇප්ස් නැහැ ඩිජිටල් බැන්කින් නැහැ. හැබැයි ඒ අයට බැංකු ගිණුම තියෙනවා. ෆෝන් එකක් තියෙනවා. තමන් බැංකුවට ෆෝන් නම්බර් එක දීලා තියෙනවා. ඉතිං OTP ආ පසු තමන් නොදැනුවත් ව වංචාකරුවන්ට ඒ OTP එක දීලා තියෙනවා. ඒ නිසා තමයි මේ දැනුවත් කිරීම් හැම දෙනාටම ඉතාමත් ම අවශ්‍ය වෙන්නේ.

අපි හිතන්නෙවත් නැති තවත් පිරිසක් සිටිනවා. මේ අය තමයි ඉතාම උගත් වෘත්තිකයින්. මේ අය ඉතා කාර්යබහුලයි. ඉතිං අර OTP එකක් ඉල්ලා කවුරු හරි කතා කළොත් මේ අය තමන්ගේ තියෙන කලබලයට නොදැනුවත් ව. ඒක දෙනවා ගොඩක් වෙලාවට ඒ අංකය ඉල්ලන්නේ හදිසි කරලා තමයි.

ගිම්හාන් මහත්මයා කිව්වා වගේ කෙටි පණිවිඩ එනවා. ඒ කෙටි පණිවිඩ හදිසි කරලා එවන්නේ. ඉතාමත් හදිසි අවශ්‍යතාවකට තමයි මුදල් ඉල්ලන්නේ. එතකොට මේ අය, හදිසිය නිසා ඒ මුදල යවනවා. වැඩිපුර අහන්නත් බැහැ. තමන් දන්න කෙනෙක් තමයි කරදරයට ලක්වෙලා තියෙන්නේ කියලා මේ මුදල් යවනවා. ඉතිං ඒක නිසා හැම කාණ්ඩයම මේකට හසුවනවා. අපිට එන පැමිණිලිවල කියවෙනවා ඒ අය දන්නවා වංචා වෙනවා කියලා. හැබැයි කලබල කරපු නිසා ඒ අය හසුවෙලා. ඒ නිසා අපි ඉතාම පරෙස්සම් වෙන්න ඕනේ.

දැන් අපි සියලු දෙනා ම මේ පද්ධතියට සම්බන්ධ වෙලා ඉවරයි. ඉතිං අපි මේ ගැන දැනුවත් වෙලා හැම තිස්සේම පරීක්ෂාවෙන් වැඩ කරන්න ඕනේ. තමන්ට එන SMS මොනවද? ඒකෙන් ඉල්ලන්නේ මොකක් ද? කියන දේ ගැන සුපරීක්ෂාකාරී වෙන්න ඕනේ. තමන්ගේ මුදල් තව කෙනෙකුට දෙන්න කලින් මේ හරි දේකට ද මම දෙන්නේ කියලා දැනගන්න. තමන් දන්නේ නැතුව වංචාවකට හසුවෙන්න පුළුවන්. දන්නේ නැතුව මියුල් (mule) ගිණුමකට එකතු වෙන්න පුළුවන්. එතකොට තමන් වංචාවේ පාර්ශ්වකරුවෙක් වෙනවා. තමන් දන්නේ ම නැතුව පොලීසි, නඩු ඒ සියල්ලට ම හසු වෙන්න පුළුවන්. ඒක නිසා ඉතාමත් පරෙස්සම් වෙන්න ඕනේ. අපි හැම දෙනා ම ළඟ මොබයිල් ෆෝන් එකක් තියෙනවා. මේ වංචාවට හසු නොවීම තමන්ගේ වගකීමක්. නොරැවටී සිටීමේ වගකීම අපි ගන්න ඕනේ.

ඩිජිටල් ගනුදෙනු සම්බන්ධව ඔබට යම්කිසි ගැටලුකාරී තත්ත්වයක් ඇත්නම් පසු පිටේ දැක්වෙන දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හරහා සම්බන්ධ වී අවශ්‍ය තොරතුරු ලබා ගන්න.■

011 2 477 642

psd@cbsl.lk

සාකච්ඡා සටහන:

වයි එම් එස් පී යාපා

සහකාර අධ්‍යක්‍ෂ

සන්නිවේදන දෙපාර්තමේන්තුව

මෙම සාකච්ඡාව නැරඹීමට පහත QR කේතය Scan කරන්න.

සංවාද සටහන - 05
(පළමුවන කොටස)

සංවාද සටහන - 05
(දෙවන කොටස)